ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"මක්නිසාද, මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස් වහන්සේ උදෙසාය. මරණයද, මට ලාභයක්ය." (ඵිලිප්පි 1:21)

83 වන වෙළුම අංක 05 (977) 2024 සැප්තැම්බර් / ඔක්තෝබර්

දිනන ජීවිත

චාල්ස් ජී ට්‍රම්බල් විසිනි

ජයග්‍රහණය කරන්නේ එක ජීවිතයක් පමණක් වන අතර එය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතයයි. සෑම මනුෂ්‍යයකුටම එම ජීවිතය තිබිය හැකි අතර සෑම මනුෂ්‍යයෙකුටම එම ජීවිතය ගත කළ හැකිය. මම අදහස් කරන්නේ සෑම මනුෂ්‍යයෙකුටම ක්‍රිස්තුස් වහන්සේ හා සමාන විය හැකි බව නොවේ. මා අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීමට මම මගේම පුද්ගලික අත්දැකීමක් ඔබට පැවසිය යුතුය. අනික් මනුෂ්‍යයන් ඔවුන්ගේ ජීවිතවල අත්කරගෙන තිබෙන බව මා දුටු අසාර්ථකත්වය, ක්‍රිස්තුස් වහන්සේව පාවාදීම් (ක්‍රිස්තුස් වහන්සේට නිග්‍රහ කිරීම්) අගෞරවය කිරීම්, ස්වර්ගීය දර්ශනවලට අකීකරුවීම් සහ ක්‍රිස්තුස් වහන්සේ මාගෙන් බලාපොරොත්තුවන දේ පිළිබඳව අනිත් මනුෂ්‍යයන් දැන සිටි දේට වඩා වැඩි යමක් මා දැන සිටි බව පවසන විට මම නිවැරදි යයි මම සිතමි. එම නිසා දුක්විඳීම්වල දී දෙවියන් වහන්සේගේ බොහෝ ඉවසිලිවන්තකම, අසීමිත ආදරය, දයාව කරුණාකොටගෙන පුද්ගලික අසාර්ථකත්වය බලාපොරොත්තු සුන්වීම පිළිබඳව දුක්බිත කතාවකට වඩා වැඩි යමක් කතා කළ හැකි වේ.

ක්‍රිස්තුස් වහන්සේගේ නැවුම් අත්දැකීමකට පැමිණීමට පෙර මාගේ ජීවිතයේ අවශ්‍යතා පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි අවබෝධයක් තිබුණි. විශේෂයෙන් කැපී පෙනෙන කාරණා තුනක් විය.

"ආත්මික ජීවිතයේ උස්පහත්වීම්", සමහර අවස්ථාවලදී මම ආත්මික වශයෙන් ඉහළ මට්ටමක සිටියෙමි. තවත් සමහර අවස්ථාවලදී ආත්මිකව පහළ ගැඹුරේ සිටියෙහි. ශක්තිමත් පෙළඹවීමක් ඇති කරන පොදු සම්මේලන, පිඹීදීම සහිත ආලේපලත් කිතුණු නායකයන්ගේ තියුණු ආමන්ත්‍රණයක් සෙවීමත්, ආත්මයෙන් පිරුණා වූ පොතක් කියවීමට හෝ දුෂ්කර කිතුණු සේවයක් කිරීම මාගේ ජීවිතයේ බැඳී සිටීමත් යාච්ඤාවෙන් සූදානම්වීමත් සමඟ එහි යෙදීම මාව ආත්මිකව ඔසවනු ලබයි. එමෙන්ම ඒවා ටික වේලාවකින් මාව නැගිටවනු ලබයි. දෙවියන් වහන්සේ ඉතා සමීපයේ සිටින බවත්, මාගේ ආත්මික ජීවිතය ගැඹුරුවී ඇති බවත් පෙනෙන්නට ඇත. නමුත් එහි නිරතුරුව පැවතිය නොහැකිය. සමහර විට එක් පරීක්ෂාවකට හසුවී අසාර්ථකවීමෙන් හෝ සමහර විට ක්‍රමක්‍රමයෙන් පහළට බැසීමේ ක්‍රියාවලියකින් මාගේ හොඳම අත්දැකීම් නැතිවී යන අතර මාව ආත්මිකව පහළ මට්ටමට නැවත පැමිණෙන්නේය. සාතන් මට නැවත නැවත පෙන්වූ පරිදි ආත්මිකව පහලට යන අනතුරුදායක තත්ත්වයක සිටින මනුෂ්‍යයෙක්වී සිටියෙමි.

"පාපයට හසුවීම" මම සටන් කළේ ජයග්‍රාහී සටනක යම් යම් නිශ්චිත මාර්ගවල නොවේ. මම පරිපූර්ණත්වය සෙවුවේ නැත. නමුත් මම සටන් කළේ අවිනිශ්චිතව සහ බාධාවකින් තොරව පුරුද්දක් ලෙසය. සෑමවිටම යම් යම් දිශාවලින් ජය ගැනීම සහ බාධා වලින් ජයග්‍රහණය ලබාගන්නවා වෙනුවට පොඩිකර දමනු ලැබූ සහ නින්දිත පරාජයන් සමඟ ගැලී සිටියෙමි. මම උනන්දුවෙන් යාච්ඤා කලත් මිදීම සහ සුපුරුදු ගැලවීම පැමිණ නැත.

"ආත්මික බලය හීනව සිටීම" මම බොහෝ කිතුණු සේවාවල යෙදුනෙමි. මම පුද්ගලික කාරණාවල වුවත් යෙදුනෙමි. සියල්ලටම වඩා අමාරු ආකාරයෙන් එකින් එක මනුෂ්‍යයාට ඔවුන්ගේ ජීවිත ගැලවුම්කරුවාණන්ට භාරදීම ගැන කථා කළෙමි. එහෙත් මම ප්‍රතිඵල නුදුටුවෙමි. මාගේ කාර්යයන් නිසා ක්‍රිස්තුස් වහන්සේ විසින් ගොඩනගන ලද ජීවිත මම නුදුටුවෙමි. මක්නිසාද මාගේ කාර්යයන් නිසා මම එය කළ යුතු විය. අනිත් අය එය ඉටු කළ නමුත් මට එය ඉටු කළ නොහැකි වූයේ ඇයි ? මාගේ කිතුණු සේවයේ අධ්‍යාත්මික වඳභාවය ගැන මම සමහර විට කම්පාට පත්වූයෙමි.

ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අළුත් අවබෝධයන්

ඔවුන්ගේ ක්‍රිස්තියානි සේවයේ දී කැපී පෙනෙන ලෙස ආශිර්වාද ලද මනුෂ්‍යයන්ට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ මනා අවබෝධයක් හෝ වැටහීමක් තිබූ බව පෙණුන අතර මට එසේ නොවීය. ක්‍රිස්තුස් වහන්සේ මා සිතූ සියලු සිතුවිලිවලට වඩා ගැඹුරු වූ සේක. මෙය මා වෙත පැමිණි පළමු අවස්ථාවේදී මම අඩුයි කියා කියන යෝජනාවට විරුද්ධව මම කැරළි ගැසුවෙමි. මම ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කර උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස උන්වහන්සේට නමස්කාර කළේ නැද්ද ? මීට වසර විස්සකට පෙර මම උන්වහන්සේ මගේ පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගත්තේ නැද්ද ? උන්වහන්සේ තුළ පමණක් සදාකාල ජීවනය ඇති බව විශ්වාස කර මාගේ මුළු ජීවිතයම උන්වහන්සේට භාර දෙමින් උන්වහන්සේගේ සේවය තුළ ජීවත්වීමට මම උත්සාහ කළේ නැද්ද ..? මම නිතරම උන්වහන්සේගේ උපකාරය සහ මඟපෙන්වීම ඉල්ලා සිටිමින් මාගේ එකම බලාපොරොත්තුව උන්වහන්සේ තුළ මම විශ්වාස කළේ නැද්ද... ? මේ සියල්ල මම කරමින් සිටියෙමි. ක්‍රිස්තුස් වහන්සේ ගැන මාගේ අවබෝධයට වඩා උසස් හෝ හොඳ සංකල්පයක් විය හැක්කේ කෙසේද ? මම කසිදාක කළාට වඩා උන්වහන්සේට සේවය කිරීම අවශ්‍ය බව දැන සිටියෙමි. නමුත් උන්වහන්සේ පිළිබඳව මට අළුත් සංකල්පයක් අවශ්‍ය බව මම පිළිගත්තේ නැත.

එසේ වුවද එය මට නොසලකා හැරිය නොහැකි පැති වලින් මා වෙතට පැමිණෙමින් තිබුණේය. එංගලන්තයේ දේශකයෙක් වූ දේවධර්මාචාර්ය ජෝන් ජොවෙට් එපීස 4:12-13 පිළිබඳව කරන දේශනාවකට මම ඇහුම්කන් දුනිමි. **"එසේ දුන්නේ ඇදැහීවේ ද දෙවියන් වහන්සේගේ පුත්‍රයා දැනගැන්වේද එකමුතුකමටත් සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ වූ උසමහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක් ශුද්ධවන්තවන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීවේ වැඩය පිණිසත් ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වර්ධනයවීම පිණිසය."** (එපීස 4:12-13) මට ඔහු පසු පස ගමන් කිරීමට නොහැකි විය. ඔහු මම දැන සිටියාට එහායින් කථා කළේය. ඔහු ක්‍රිස්තුස් වහන්සේ ගැන කථා කළේ සම්පූර්ණයෙන්ම මම ක්‍රිස්තුස් වහන්සේව නොදැන සිටි ආකාරයකට වූයේය.

මම දේවධර්මාචාර්ය ජෝන් ඩග්ලස් ඇඩම්ව හඳුනාගෙන ඔහුගෙන් ඉගෙන ගත්තේ, යේසුස් වහන්සේගේ සැබෑ පැවැත්ම පිළිබඳව නොපැකිලෙන අවබෝධය ඔහුගේ ලොකුම අධ්‍යාත්මික සම්පත බවයි. කිසිවක් ඔහුට වෙහෙසකර වූයේ නැත. ඔහු සෑමවිටම කථා කළේ යේසුස් වහන්සේ සෑමවිටම ඔහු සමඟ සිටින බව වටහා ගැනීමෙනි. මෙය ඔහුගේ හැඟීම්වලින් නිදහස්ව තිබූ බවත්, ඔහුගේ නිදහස අත්හැර තිබූ බවත්, යේසුස් වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කරන ආකාරය ඔහුගේ අදහස් වලින් නිදහස්ව තිබූ බවත් ප්‍රකාශ විය. එපමණක් නොව ක්‍රිස්තුස් වහන්සේගේ සිතුවිලි ඔහු තුලින් පැමිණෙන බවත් කීවේය. ඔහුගේ මනස වෙනත් කාරණාවලින් නිදහස් වූ විට එය ක්‍රිස්තුස් වහන්සේ වෙත හැරෙනු ඇත. ඔහු ඕනෑම තැනක සිටින විට තම මිතුරෙකුට මෙන් පහසුවෙන් හා ස්වභාවිකව හඬ නඟා ක්‍රිස්තුස් වහන්සේට කථා කළේය. යේසුස් වහන්සේගේ සැබෑ අභිමුඛත්වය ඔහුට එපමණ සැබෑවක් වූයේය.

මාස කිහිපයකට පසුව මම එඩ්ම්බරෝහී සම්මන්ත්‍රණයකට සහභාගි වූ අතර ආචාර්ය රොබට් හෝර්ටන් ක්‍රිස්තියානි ජීවිතයේ සම්පත් ගැන කථා කිරීමට නියමිතව සිටියේය. අපගේ කිතුණු ජීවිතය ශක්තිමත් කිරීම සඳහා අපට කළ හැකි නිශ්චිත දේවල් මාලාවක් ඔහු අපට දෙනු ඇතැයි මම අපේක්ෂා කළෙමි. ඒවා මට අවශ්‍යව තිබෙන බව මම දැන සිටියෙමි. නමුත් ඔහුගේ ආරම්භක වාක්‍යය මගේ වැඩ්ද මට පෙන්වූ අතර එය මගේ හදවතට නව ප්‍රීතියේ පිම්මක් ගෙනාවේය. ඔහු පැවසුවේ මෙවැනි දෙයකි. **"මාගේ මිතුරාණි, කිතුණු ජීවිතයේ සම්පත් යේසුස් ක්‍රිස්තස් වහන්සේ පමණි."** උන්වහන්සේ පමණි, නමුත් එය ප්‍රමාණවත් විය. පසුව මම ආචාර්ය හෝර්මන් සමඟ මගේ පුද්ගලික අවශ්‍යතා සහ දුෂ්කරතා ගැන කථා කරන විට ඉතා සරලව මෙසේ කීවේය. ට්‍රම්බල් මහත්මයා, අපි වඩාත් නිර්හීත ඇදහිල්ලකින් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පා තැබුවොත් උන්වහන්සේට තවත් බොහෝ දේ අප වෙනුවෙන් කළ හැකි වන සේක.

මම මහා බ්‍රිතාන්‍යයෙන් පිටත්ව යාමට පෙර මාගේ මිතුරෙකු ලන්ඩනයේ ඔහුගේ දේවස්ථානයේ දී වේල්සයේ තරුණ දේවගැතිවරයෙකු වන

2 පිටුවට

1 පිටුවෙන්

දිනන ජීවිත...

රිවඩ් රොබට්ස්ට දේශනාවකට වස්ථාව ලබා දී තිබුණේය. මා මෙකේ නොදැන සිටි ක්‍රිස්තුස් වන්සේ ගැන මා තුළ තිබූ සිතුවිල්ලට එහා ගිය සිතුවිල්ලකට නැවත වරක් මුහුණදීමට මට සිදු විය. ඔහුගේ බයිබල් පාඨය වූයේ "මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස් වහන්සේ උදෙසාය. මරණය ද මට ලාභයක්ය." (පිලිප්පි 1:21) යන්නයි. එය එකම තේමාවක් විය. ක්‍රිස්තුස් වහන්සේ වන ජීවිතය, මුළු ජීවිතය සහ එකම ජීවිතය ලෙස දිගහැරීමයි.

ටික වේලාවකට පසුව මම සම්මන්ත්‍රණයකට සහභාගි වෙමින් සිටියෙමි. ඉන්දියාවේ බිෂොප් ඕල්ඩ්හැම්" ජීවනයේ ජලය යන මාතෘකාව යටතේ කථා කළේය. උන්වහන්සේගේ සෑම අනුගාමිකයෙක්ම කඩින්කඩ නොව, බාධාවකින් නොව, අඛණ්ඩව හා නොබිදිය හැකි ප්‍රවාහයකින් යුක්තව සැමදාම අන්‍යයන්ට ජීවමාන දිය උල්පතක්වීම ක්‍රිස්තුස් වහන්සේගේ පැතුම සහ අරමුණ බව ඔහු පැවසුවේය. **"මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේ යයි කී සේක."** (යොහාන් 7:38) ඇතැම් අයට ජීවන ජලය ස්වල්පයක් ඇති බවත්, එය නතර කළ නොහැකි මහත් ජලධාරාවක් විය යුතු බවත් කීවේය. ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමේ පුදුමාකාර දේවසේවයකට සවන්දුන් අපව ලැජ්ජාවට පත් කළ නැගෙනහිර ප්‍රදේශයේ ස්වදේශික වයෝවෘද්ධ කුඩා කාන්තාවක් ගැන ඔහු විස්තර කළේය. ඒ වන විට ඇය යේසුස් වහන්සේව දැනගන අවුරුද්දක් පමණක් වූයේය.

එය තුළින් යාච්ඤා කරන්න.

ඊළඟ උදෑසන මාගේ කාමරයේ මම තනිවම සිට දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ උන්වහන්සේගේ මාර්ගය පෙන්වන ලෙයයි. ක්‍රිස්තුස් වහන්සේ ගැන මට නොතිබුණු මට අවශ්‍ය වූ, මා අසා ඇති සහ මා දැක ඇති තවත් සමහර අයගේ ජීවිතවල රහස එය වූ බැවින් මට මෙතෙක් ඇති සියල්ලට වඩා යහපත් වැටහීමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියෙමි. රිවඩ් රොබට්ස්ගේ **"මට ජීවත්වීමට ක්‍රිස්තුස් වහන්සේ"** යන දේශනාව මා ළඟ තිබී එය දණින් වැටී අධ්‍යයනය කළෙමි. ඊළඟට මම නැවත යාච්ඤා කළ අතර දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ බොහෝ ඉවසිලිවන්තකම, සමාවදීම සහ ආදරය නිසා මා ඉල්ලූ දේ මට ලබාදුන් සේක. උන්වහන්සේ මට ක්‍රිස්තුස් වහන්සේව අළුත් ආකාරයකින් ලබාදුන් සේක. දැන් මගේ බවට පත් වූ ක්‍රිස්තුස් වහන්සේව අවබෝධ කර ගැනීම සම්පූර්ණයෙන්ම අළුත්ය.

වෙනස සිදු වූයේ කොතැනද ? ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ ජීවිතය සහ ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීම ගැන නව ගිවිසුම පුරා ඇති බොහෝ යොමු කිරීම් වචනාර්ථයෙන් සත්‍ය, ආශිර්වාදලත්, සත්‍යයක් මිස නිකම්ම කථාන්තරයක් නොවන බව මම පලමුවරට තේරුම් ගතිමි. මම දැන් යොහාන් 15 වන පරිච්ඡේදය කියවන විට නව ජීවිතයක සතුටට පත්වන ආකාරය අත්දුටුවෙමි. (එපීස 3:14:21, ගලාති 2:20, පිලිප්පි 1:21) ක්‍රිස්තුස් වහන්සේ මාගේ ගැලවුම්කරුවාණන් බව මම දැන සිටියත් මම උන්වහන්සේ දෙස බැලුවේ භාහිර ගැලවුම්කරුවෙකු දෙස බලන්නාක් මෙන්ය. පිටතින් මා වෙනුවෙන් ගැලවීමේ කාර්යයක් කළ කෙනෙකු ලෙස සහ මා අසලට පැමිණ මාගේ සමීපයේ සිටින කෙනෙකු ලෙසිනි. එමෙන්ම මට අවශ්‍යය සෑම දෙයකදීම මට උපකාර කිරීම, මට බලය ශක්තිය සහ ගැළවීම ලබාදෙන කෙනෙකු ලෙසින්ය. නමුත් දැන් මම ඊට වඩා හොඳ දෙයක් තේරුම් ගතිමි. අවසානයේ දී මා තේරුම්ගත්තේ ක්‍රිස්තුස් වහන්සේ වචනාර්ථයෙන්ම මා තුළ සිටින බවත් මාගේ මුළු ශරීරය, මනස, ආත්මය සහ මගේ මුළු ජීවිතයම මගේ විරුද්ධත්වයක් නැතිව උන්වහන්සේගේ කරගෙන තිබීමයි. මෙය වඩා හොඳ වූයේ උන්වහන්සේ උපකාර කරන්නෙකු ලෙස සිටීම හෝ භාහිර ගැලවුම්කාරයෙකු ලෙස සිටිනවාට වඩා යේසුස් වහන්සේ වන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ මගේම ජීවිතය ලෙසද සිටීමයි.

එයින් අදහස් කළේ උන්වහන්සේ එක්කෙනක් සහ මම තවත් කෙනෙක් ලෙස මට නැවත කිසි දිනෙක මට උදව් කරන ලෙස මම උන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතු නැති බවත්, ඒ වෙනුවට උන්වහන්සේගේ කාර්යය, උන්වහන්සේගේ කැමැත්ත මා තුළ මා සමඟ සහ මා තුලින් ඉටුකරන ලෙසයි. මගේ ශරීරය, මගේ මනස, මගේ ආත්මය, මගේ කැමැත්ත නිකම්ම උන්වහන්සේගේ නොව වචනාර්ථයෙන්ම උන්වහන්සේගේ කොටසක් විය. උන්වහන්සේ ප්‍රකාශ කිරීමට සහ විශ්වාස කිරීමට මගෙන් ඉල්ලා සිටියේ **"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේවී නමුත් මම ජීවත් වෙමි. නමුත් තවත් මා නොව කිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිත මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි අදහිල්ලෙන් ජීවත්වෙමි." (ගලාති 2:20) ක්‍රිස්තුස් වහන්සේ මගේ ජීවිතය සැබෑ සත්‍යයක් ලෙස පිහිටුවාගෙන තිබෙන සේක. "මක්නිසාද සිංහාසනය වේවා, ස්වාමීකම වේවා, අධිපතිකම් වේවා, බලපෘතුව වේවා ස්වර්ගවල සහ පොලොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල් ද, නොපෙනෙන්නා වූ දේවල් ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරුණුකොටගෙන ද උන්වහන්සේ උදෙසා ද මවා තිබේ. උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක. සියල්ල ද උන්වහන්සේ තුළ පවතින්නේය. උන්වහන්සේ සභාව නැමති ශරීරයට හිසව සිටින සේක. උන්වහන්සේ පටන්ගැන්මව, මළවුන්ගෙන් කැළුදුලාව සිටින සේක. එසේව සිටින්නේ උන්වහන්සේම සියල්ලට ප්‍රධානව සිටින පිණිසය."** (කොලොස්සි 1:16-18)

"මාගේ ජීවත්වීම ක්‍රිස්තුස් වහන්සේ උදෙසාය." කියා පාවුල් තුමාට උතුරන ප්‍රීතියෙන් සහ ජයග්‍රාහිකව පැවසීමට හැකිවීම ගැන ඔබ පුදුම වෙනවාද .. ? මාගේ ජීවත්වීම ක්‍රිස්තුස් වහන්සේ මෙන් විය යුතුය කියා හෝ මාගේ ජීවත්වීම ක්‍රිස්තුස් වහන්සේගේ උපකාරය ලැබීමයි කියා වැරදියට සිතුවෙමි. මාගේ ජීවත්වීම යනු මා උදෙසා ජීවත්වීමයි කියාවත්, මම ජීවත්වන්නේ ක්‍රිස්තුස් වහන්සේට සේවය කිරීමටයි කියාවත් ඔහු පැවසුවේ නැත. ඒ සියල්ලෙන් එහාට ඔහු යොමුවන්නේ "මාගේ ජීවත්වීම ක්‍රිස්තුස් වහන්සේ උදෙසාය" යන නිර්භීත තේජාන්විත, අරුම පුදුම ප්‍රකාශයෙනි. ඒ වාක්‍යය මීට කලින් කවදාවත් මට තේරුණේ නැත. දැන් උන්වහන්සේගේ ත්‍යාග යට ස්තුතිවන්ත වෙන්න මම එහි අපූරු අර්ථය දෙස බැලීමට පටන් ගත්තෙමි.

පුද්ගලික දැනුම

දිනන ජීවිතයක් තිබෙන බව මම දන්නේ ඒ විදිහටයි. එය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයයි. අපේ ජීවිතවලට අතුල්වීමට, හිඳගැනීමට උන්වහන්සේට ඉඩ හරිනවාදැයි අපි අපගෙන්ම ඇසිය යුතුය. උන්වහන්සේගෙන් අපව වසා ගැනීමට සහ කොන්දේසි විරහිතව අපගේ ජීවිතය සහ කැමැත්ත උන්වහන්සේට යටත් කර දුන්නොත් උන්වහන්සේ අපගේ ජීවිතවල ස්වාමියා සහ අපගේ ගැලවුම්කරුවාණන් බවට පත්වන සේක. දෙවියන් වහන්සේගේ සම්පූර්ණත්වය දක්වා අපව උන්වහන්සේ පුරවනු ලබන සේක. මනුෂ්‍යයෙකුට ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතයේ පූර්ණත්වය ලෙස පිළිගන්නා විට නැවත පව් කළ නොහැකි බවට වැරදි ධර්මයක් මම යෝජනා කරන්නේ යැයි නොසිතන්න. ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතය තවමත් අපට අපගේ නිදහස් කැමැත්ත ඉතිරිකර තිබේ. එම නිදහස් කැමැත්තෙන් ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධවීමටත් (අවනත නොවීමටත්) අපට පුළුවන. එමෙන්ම මා කථා කරන නව අත්දැකීමේ සිට මාගේ ජීවිතයේ එවැනි අවනත නොවීමේ පාපයන් පැවතුණි. නමුත් එලෙස අසාර්ථකවීමෙන් පසු නැවත යථාතත්වයට පත්වීමට අස්වභාවික ලෙස ආශිර්වාද ලැබුණි. ක්ෂණිකව සම්පූර්ණ විය හැකි බව මම ඉගෙන ගතිමි. මම ක්‍රිස්තුස් වහන්සේට යටත්වීම විශ්වාස කරන බැවින් පාපයට එරෙහිව සටන් කිරීම අවශ්‍ය වන බවත් එසේ වුවත් පාපයේ බලයෙන් සහ පාපයේ ආශාවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතු බවත් ඉගෙන ගතිමි. ක්‍රිස්තුස් වහන්සේ මගේ ජීවිතය පවිත්‍ර කරන බව සහ මාගේ ජීවිතයේ රජකරන බව මම සරලව අවබෝධ කරගන්නා විට මෙම නිදහස සහ ජය ගැනීමට වඩා නොබිදුණු අඛණ්ඩ පැවැත්මකින් පවතින බව මම ඉගෙන ගතිමි.

අවශ්‍යතා සපුරා ඇත.

මම ආරම්භයේ දී කථා කළ විශාල අවශ්‍යතා තුන ආශ්චර්‍යමත් ලෙස ඉටු වී ඇත.

(1) මම මීට පෙර මගේ ජීවිත කාලය පුරාම දැන සිටි ඕනෑම දෙයකට වඩා හාත්පසින්ම වෙනස් සහ අසීමිත ලෙස යහපත් වූ දෙවියන් වහන්සේ සමඟ ස්ථිරසාර සහයෝගීතාවයක් මට තිබේ.

2) නිදහස සඳහා මම ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කළ විට නිශ්චිතව මාව වටකර ගන්නා වූ පාපයට ඉහළින් සිට මාව විනාශයට ගෙන ගිය පැරණි කාරණාවලට එරෙහිව නව ආකාරයකින් ජයග්‍රාහකයෙක්වී ජයග්‍රහණය ලබා ඇත.

(3) අවසාන වශයෙන් සේවයේ ආත්මික ප්‍රතිඵල මට පොළොවේ දී කළ හැකි දෙයක් බව මම කිසිදා නොදැනී සිටියත් ස්වර්ගයේ ප්‍රීතිය බෙදා ගැනීමක් දැන් මට ලබා දී තිබෙන සේක. මගේ ඉතා සමීප මිතුරන් හයදෙනෙක් සිටි අතර ඔවුන් බොහෝ පරිණත කිතුණුවන් විය. ඔවුන්ගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේ විසින් සම්පූර්ණයෙන්ම විප්ලවීය ලෙස වෙනස්කර ඇත. මේ අළුත් ආකාරයෙන් උන්වහන්සේව අල්ලාගෙන දෙවියන් වහන්සේගේ සම්පූර්ණත්වය උන්වහන්සේගෙන් ලබාගෙන ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ වාසය කිරීමට ප්‍රථම ස්ථානය දෙන ඕනෑම කෙනෙක් හරහා අනිත් අයගේ ජීවිත තුළ ක්‍රිස්තුස් වහන්සේ ඉටුකිරීමට කැමැත්තෙන් සිටින සහ කළ හැකි දේ පිළිබඳව ආශ්චර්‍යමත් සාක්ෂිවලින් ජීවිතය පිරී පවතින්නේය.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍යවන්නේ අපගේ උපකාරකයාණෝවීමට පමණක් නොවේ. උන්වහන්සේ අවශ්‍ය වන්නේ අපගේ ජීවිතයවීමටය. උන්වහන්සේට අවශ්‍ය වන්නේ අපි උන්වහන්සේ වෙනුවෙන් වැඩකරනවාට නොව, උන්වහන්සේට අවශ්‍යවන්නේ උන්වහන්සේට වුවමනා කාර්‍ය කිරීමට අප තුළ උන්වහන්සේට ඉඩ ලබාදීමයි. අපගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේගේවීම පමණක් නොව නමුත් අපගේ ජීවිත තුළ උන්වහන්සේට ඉඩ ලබාදීමයි. අපගේ ජීවිත ක්‍රිස්තුස්වහන්සේගේ වීම පමණක් නොව නමුත් අපගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේ වූ විට අපගේ ජීවිත ජයග්‍රාහී ජීවිත වනු ඇත. මක්නිසාද උන්වහන්සේට අසාර්ථකවීමට නුපුළුවන. එමෙන්ම ජයග්‍රාහී ජීවිතයක් යනු ඵල දරණ ජීවිතයකි. සේවය කරන්නා වූ ජීවිතයකි. අපි ක්‍රිස්තුස් වහන්සේට අප හරහා අනිත් අයට සේවය කිරීමට ඉඩ දෙන බැවින් අපගේ සේවය සම්පූර්ණයෙන්ම අලුත් ආකාරයේ සේවයක් වනු ඇත. තවද මෙම ඵලදැරීම, සේවය සහ පුරුදු නිරන්තරයෙන්ම ඇදහිල්ලෙන් විය යුතුය. අපගේ ක්‍රියා අප තුළ සිටින උන්වහන්සේගේ ජීවිතයේ ප්‍රතිඵලයකි. එය එම ජීවිතයේ තත්ත්වය වන අතර එය රහසක් නොවේ.

කොන්දේසි තුනක්

ක්‍රිස්තුස් වහන්සේව ජීවිතයේ පූර්ණත්වය ලෙස පිළිගැනීමේදී කොන්දේසි තුනක් තිබෙන බව පෙනෙන්නේය. ඇත්ත වශයෙන්ම අපගේ පාපයේ දොස් පැවරීමේ ප්‍රතිවිපාක වලින්, පාපයේ බලයෙන්

3 පිටුවට

2පිටුවෙන්

දිනන ජීවිත...

සහ අපගේ වරදකාරීත්වයෙන් සම්පූර්ණයෙන්ම පසුතැවිලිවීමෙන් පසුව ක්‍රිස්තුස් වහන්සේව අපගේ පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගනු ලබන්නෙමු. එවිට,

(1) අප සිටින සියල්ලේ දී සහ අප සතු සියල්ලේ ස්වාමියා ලෙස ක්‍රිස්තුස් වහන්සේට කොන්දේසි විරහිතව යටත් විය යුතුය.

(2) අපගේ ජීවිත ලෙස ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වයේ මෙම දීමනාව දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

(3) අප ඉල්ලූ දේ කරන්නට යන බව නොව කර ඇති බව විශ්වාස කරන්න.

මෙම තුන්වන පියවර මත ඇදහිල්ලේ ක්‍රියාවේ සියල්ල රදා පවතියි. අපගේ ඇදහිල්ල කිසිදු හැඟීමක් හෝ සාක්ෂියක් නොමැතිව දෙවියන් වහන්සේව විශ්වාස කිරීමට කැමැත්ත ඇතිව සිටිය යුතුය. මක්නිසාද දෙවියන් වහන්සේගේ වචනය උන්වහන්සේගේ ඕනෑම සාක්ෂියකට වඩා ආරක්ෂිතව, වඩා යහපත්ව සහ විශ්වාසදායකව තිබේ. තවද ක්‍රිස්තුස් වහන්සේම උන්වහන්සේගේ ඕනෑම ආශීර්වාදයකට වඩා උන්වහන්සේම ලබාදෙන බලයට හෝ ජයග්‍රහණයට හෝ සේවයට වඩා හොඳ බව මතක තබාගන්න. ක්‍රිස්තුස් වහන්සේ ආත්මික බලය නිර්මාණය කරන සේක. නමුත් ක්‍රිස්තුස් වහන්සේ බලයට වඩා යහපත්ව සිටින සේක. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ හොඳම දෙයයි.

උන්වහන්සේ දෙවියන් වහන්සේය. අපට මේ හොඳම දේ තිබිය හැකිය. අපට ක්‍රිස්තුස් වහන්සේ සිටිය හැකිය. මේ තරම් සම්පූර්ණත්වයකින් හා තමන්වම අත්හැරීමකින් උන්වහන්සේට යටත් විය හැකිය. තවදුරටත් ජීවත්වන්නේ අප නොව ක්‍රිස්තුස් වහන්සේ අප තුළ ජීවත්වන සේක. ඔබ උන්වහන්සේව ඔබ තුළ රැගෙන යාමට කැමතිද ... ?

ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය

"මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය. සියලු අධිපතිකමේද, බලයේද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය."
(කොලොස්සි 2:9-10)

සම්පූර්ණ යන වචනය පූර්ණත්වය යන එකම මුල් වචනයෙන් පරිවර්තනය කර ඇති බවත් එබැවින් අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ පූර්ණ වී ඇත යන අදහස පවතින බවත් මම දැනගත් විට මෙම බයිබල් කොටස තුලින් මෑතකදී මට අලුත් අර්ථයක් ලබා දුන්නේය. වෙනත් වචන වලින් කියනවා නම් ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය දේවත්වයේ පූර්ණත්වයයි. අපි උන්වහන්සේ තුළ පූර්ණ වී හෝ උන්වහන්සේ තුළ සම්පූර්ණ කර ඇත. අපෝස්තුළු යොහාන් එය මෙසේ සඳහන් කර ඇත. **"කුවක් හෙයින්ද උන්වහන්සේගේ පූර්ණකමෙන් අපි සියල්ලෝම අනුග්‍රහය ලබමුව."** (යොහාන් 1:16)

ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය පිළිබඳ විෂය විශ්වාස කළ නොහැකි තරම් සත්‍යයක් බවට පත්කර ඇත. ක්‍රිස්තුස් වහන්සේ යනු කවුද ? කියා සහ උන්වහන්සේට ලබාදිය හැකි දේ සලකා බලන විට අපට හිඟවිය හැකි මොනවාද ? යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණාකොටගෙන දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මහිමය උදෙසා අපට අවශ්‍ය සියල්ල ලබා දෙන බව පුදුමයට කාරණයක් නොවේ. (පිලිප්පි 4:19) ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය බලය තුලින් අපගේ ජීවිතවලට සහ දේවභක්තියට අවශ්‍ය සියලු දේ ලබා දී ඇති බවත් ශුද්ධ ලියවිල්ලේ සඳහන්වීම පුදුමයක් නොවේ. (2 ප්‍රේතුස් 1:3) ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය ගැන මොහොතකට සිතන්න.

අපගේ මහිමාන්විත ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේය

"උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ ස්වරූපය. වුළු මැවිල්ලේ කුළුදුලාණෝය. මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා , අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල් ද, නොපෙන්නා වූ දේවල් ද යන සියල්ල උන්වහන්සේ තුළ වවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරුණාකොටගෙනද උන්වහන්සේ උදෙසා ද වවා තිබේ. උන්වහන්සේ සියල්ලටම පළවුවෙන් සිටින සේක. සියල්ල උන්වහන්සේ තුළ පවතින්නේය." (කොලොස්සි 1:15-17)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ මහිමයේ දීප්තියයි. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ මහත්තත්ත්වයේ ප්‍රභවය ද වන සේක. (හෙබ්‍රෙව් 1:3) උන්වහන්සේ දෙවියන් වහන්සේගේ රූපකාරය දරණ සේක්. (පිලිප්පි 2:6) උන්වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ පූර්ණකම පවතින සේක. (කොලොස්සි 1:19) උන්වහන්සේ දෙවියන් වහන්සේය. (යොහාන් 1:1) උන්වහන්සේ සියල්ලට වඩා උතුම් වූ දෙවියන් වහන්සේය. (රෝම 9:5) උන්වහන්සේ වචනයේ බලයෙන් සියල්ල දරා සිටින සේක. (හෙබ්‍රෙව් 1:3) උන්වහන්සේ අල්ෆා සහ ඔමේගාය. පටන්ගැන්ම සහ අවසානයයි.

පළමුවෙනියා සහ අන්තිමයාය. (එළිදරව් 22:13) උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. (මතෙව් 16:16) උන්වහන්සේත්, පියාණන් වහන්සේත් එක තැනැත්තාය (යොහාන් 10:30) පියාණන් වහන්සේගේ නාමය දන්වන සේක. (යොහාන් 17:26) උන්වහන්සේ, පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ වැඩ හිඳින සේක. (කොලොස්සි 3:1) උන්වහන්සේ මාර්ගය ද, සත්‍යය ද, ජීවනය ද වන අතර පියාණන් වහන්සේ වෙතින් පැමිණෙන්නා වූ එකම මාර්ගයයි. (යොහාන් 14:6)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ වචනයයි. (එළිදරව් 19:13) උන්වහ්නසේ ප්‍රකාශ කළ වචනවල ආත්මය ද. ජීවනය ද වන සේක. (යොහාන් 6:63) ප්‍රඥාවේ සහ දැනුමේ සියලු වස්තුව සඟවා ඇති දෙවියන් වහන්සේගේ අභිරහස යේසුස් වහන්සේ වන සේක. (කොලොස්සි 2:2-3) උන්වහන්සේ අත්තිවාරම වන සේක. (1 කොරින්ති 3:11) උන්වහන්සේ ජීවමාන ගලය. (1 ප්‍රේතුස් 2:4) එමෙන්ම උන්වහන්සේ අනර්ඝ වූ කොනේ ප්‍රධාන ගලවන සේක. (1 ප්‍රේතුස් 2:6)

උන්වහන්සේ ජීවනදායක වූ කැමයි. (යොහාන් 6:35) සදාකාලයට පවතින්නා වූ ආහාර උන්වහන්සේ ලබාදෙන සේක. (යොහාන් 6:27) උන්වහන්සේ ආත්මික පර්වතයයි. (1 කොරින්ති 10:4) උන්වහන්සේ ලබාදෙන්නා වූ ජීවනය නික්මවන්නා වූ ජලය පානය කරන අයට නැවත පිපාසා නොවන්නේය. (යොහාන් 4:14) උන්වහන්සේ ශුද්ධාත්මයෙන් සහ ගින්නෙන් බෞතිස්ම කරන සේක. (මතෙව් 3:11)

උන්වහන්සේ සැබෑවූ මිදිවැලයි. (යොහාන් 15:1) ජීවනයේ බහුලත්වය ලබාදෙන උල්පතයි. (යොහාන් 10:10) සම්පූර්ණ ප්‍රීතිය ලබාදෙන සේක. (යොහාන් 15:11) අස්වභාවික සමාදානය ලබාදෙන සේක. (යොහාන් 14:27) උන්වහන්සේ බලාපොරොත්තුවේ උල්පතයි. (1 තෙසලෝනික 1:3) ශක්තියේ උල්පතයි. (පිලිප්පි 4:13) සදාකාල සැනසිල්ලේ උල්පතයි. (2 තෙසලෝනික 2:16-17) උන්වහන්සේ සහනයේ උල්පතයි. (මතෙව් 11:28-29) උන්වහන්සේ ඉවසීමේ උල්පතයි. (2 තෙසලෝනික 3:5) උන්වහන්සේ ධර්මිෂ්ඨකමේ උල්පතයි. (පිලිප්පි 1:9) උන්වහන්සේ පවිත්‍ර කිරීමේ උල්පතයි. (1 කොරින්ති 1:2)

උන්වහන්සේ කරුණාවෙන් හා සත්‍යයෙන් පූර්ණව සිටින සේක. (යොහාන් 1:14) අනුකම්පාවෙන් පූර්ණව සිටින සේක. (මතෙව් 9:36) බොහෝ සෙයින් ඉවසා දරා සිටින සේක. (1 තිමෝති 1:16) උන්වහන්සේගේ ප්‍රේමයේ දිග, පළල, උස, ගැඹුර තුළ ඇති උතුම්කම අවබෝධ කරදෙන සේක. (එපීස 3:18-19) උන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව වෙන් කළ නොහැකිය. (රෝම 8:35) උන්වහන්සේ විශ්වාසය, සැබෑය. (එළිදරව්ව 19:11).

රිව් කාර්මයිකල් විසිනි

උන්වහන්සේගේ නාමය යේසුස්ය. මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපයෙන් ගලවන්නේ උන්වහන්සේය. (මතෙව් 1:21) උන්වහන්සේගේ නාමය අන් සියලු නාමවලට වඩා උසස්ව තිබෙන සේක. (පිලිප්පි 2:9) වෙන කිසිවෙකු තුළ ගැලවීම නැත්තේය. (ක්‍රියා 4:12) උන්වහන්සේ ලෝකයේ ගැලවුම්කරුවාණෝය. (යොහාන් 4:42) කෙළවර දක්වාම ගලවාගැනීමට උන්වහන්සේට හැකිව සිටින සේක. (හෙබ්‍රෙව් 7:25)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණෝය. (යොහාන් 1:29) උන්වහන්සේගේ ලේ අනර්ඝව තිබෙන සේක. (1 ප්‍රේතුස් 1:19) මිදීම සහ සමාවදීමේ උල්පත උන්වහන්සේ වන සේක. (කොලොස්සි 1:14) උන්වහන්සේ යහපත් බැටලු එඬේරා බැවින් බැටළුවන් උදෙසා තම ජීවිතය දෙන්නේය. (යොහාන් 10:14-15) උන්වහන්සේ අපේ ආත්මවල එඬේරා ද, රැකවලාද වන සේක. (1 ප්‍රේතුස් 2:25) උන්වහන්සේ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර මැදහත්කම් කරන සේක. (1 තිමෝති 2:5, 1 යොහාන් 2:1)

උන්වහන්සේ දාවිත්ගේ පුත්‍රයාණෝය. (මතෙව් 15:22) උන්වහන්සේ මනුෂ්‍යය පුත්‍රයා වන සේක. (මතෙව් 16:27) පරීක්ෂා කරනු ලබන්නන්ට උපකාර කිරීමට උන්වහන්සේ කරුණාවන්ත සහ විශ්වාසවන්ත වූ උත්තම පූජකයාව සිටින සේක. (හෙබ්‍රෙව් 2:17-18) උන්වහන්සේ යටහත් වී අප හා සමාන මනුෂ්‍යයෙක් වූ සේක. (පිලිප්පි 2:7-8) අපේ දුර්වලකම්වලදී අපට අනුකම්පා කරන සේක. (හෙබ්‍රෙව් 4:15) **"වෙසේ වූයේ උන්වහන්සේව අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත් සේකැයි අනාගතවකතෘ යෙසායා කරුණාකොටගෙන කියන ලද කාර්යාව සම්පූර්ණ වන පිණිසය."** (මතෙව් 8:17) උන්වහන්සේ සුවය ලබා දෙන සේක. (මතෙව් 4:23) අපව නිදහස් කරනු ලබන සේක. (යොහාන් 8:36) මුදාගන්නා සේක. (ගලාති 1:4) බලවත් ක්‍රියාවන් කළ සේක. (මතෙව් 13:54) අප උදෙසා මැදහත්කම් කිරීමට උන්වහන්සේ නිරතුරුව ජීවමානව සිටින සේක. (හෙබ්‍රෙව් 7:25)

උන්වහන්සේ ලෝකයෙන් ජයගත් සේක. (යොහාන් 16:33)

4පිටුවට

3 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේගේ...

උන්වහන්සේ අපගේ ජයග්‍රහණයේ උල්පතයි. (රෝම 8:37) උන්වහන්සේ අපගේ ඇදහිල්ලේ කතෘවරයා සහ සම්පූර්ණ කරන්නා ද වන සේක. (හෙබ්‍රෙව් 12:2) අන්තිමය දක්වා අපව ආරක්ෂා කරන සේක. (1 කොරින්ති 1:8)

උන්වහන්සේව කුරුසපත් කරනු ලැබීමෙන් පසු තැන්පත් කරනු ලැබීය. නමුත් දෙවියන් වහන්සේ උන්වහන්සේව මරණයෙන් නැගිටෙවු සේක. (1 කොරින්ති 15:3-4) උන්වහන්සේ නැවත නැගිටීමත් ජීවනයත් වන සේක. (යොහාන් 11:25) උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමේ කුළුදුලා වන සේක. (එළිදරව් 1:5) උන්වහන්සේ සදාකාලේටම ජීවත්ව සිටින අතර මරණයේ සහ හේදිසයේ යතුරු උන්වහන්සේ සතුව තිබෙන සේක. (එළිදරව් 1:18) ***"බැස්සාවූ උන්වහන්සේ නවී සියල්ල පූර්ණ කරන පිණිස සියලු ස්වර්ගවලින් ඉහළට නැගුණා වූ තැනැත්තා වහන්සේමය."*** (එපීස 4:10) උන්වහන්සේ මනමාලයා වන සේක. (මතෙව් 9:15) උන්වහන්සේගේ මහිමය අප විසිනුත් දරා සිටීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (යොහාන් 17:24) උන්වහන්සේ අපගේ ආශිර්වාදලත් බලාපොරොත්තුවයි. (තීතස් 2:13) උන්වහන්සේගේ නැවත පැමිණීම දැඩි උනන්දුවකින් බලා සිටින්නන් උදෙසා නැවත පැමිණෙන සේක. (හෙබ්‍රෙව් 9:28) යේසුස් වහන්සේ උන්වහන්සේගේ පියාණන් වහන්සේගේ මහිමය සහ දේවදූතයන් සමඟ නැවත පැමිණෙන සේක. මතෙව් (16:27)

උන්වහන්සේ රජුන්ගේ රජතුමා සහ ස්වාමීන්ගේ ස්වාමීතුමා වන සේක. (එළිදරව් 19:16) පොළොවේ රජුන්ගේ අධිපතියා වන සේක. (එළිදරව් 1:5) " සියලු දේ පවා තමන්ට යටත් කරන්ට පුළුවන් වූ බලය ලෙස උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමාන වන පිණිස ඒවා වෙනස් කරනවා ඇත." (පිලිප්පි 3:21) මැවිල්ල උන්වහන්සේගේ ආධිපත්‍යය යටතේ තිබෙන සේක. (මතෙව් 8:27) පාපයට සමාවදීමේ බලය උන්වහන්සේ සතුව තිබෙන සේක. (මතෙව් 9:2) ස්වර්ගයෙත්, පොළොවෙත් සියලු බලය ඇතිව සිටින සේක. (මතෙව් 28:18) සියලු දේ උන්වහන්සේගේ අතට බාර දී තිබෙන සේක. (යොහාන් 3:35) එකිනෙක පුරුෂයාගේ හිස උන්වහන්සේය. (1 කොරින්ති 11:3) උන්වහන්සේ සභාවේ හිස වන සේක. (එපීස 5:23) සියලු අධිපතිකමේද බලයේ ද හිස උන්වහන්සේ වන සේක. (කොලොස්සි 2:10) තමන් කෙරෙන් අධිපතීන් ද බලයලන්නන්ද පහකොට ඔවුන්ගෙන් ජය ගත් සේක. (කොලොස්සි 2:15) උන්වහන්සේ යක්ෂයාගේ ක්‍රියා විනශ කළ සේක. (1 යොහාන් 3:8) මරණය අවලංගු කර ජීවනයත් අමරණභාවයත් ප්‍රකාශ කළ සේක. (2 තිමෝති 1:10) මලවුවන්ගේද, ජීවතුන්ගේද ස්වාමීන් වහන්සේ වන සේක. (රෝම 14:9) උන්වහන්සේ දෙවියන් වහන්සේගේ බලය සහ දෙවියන් වහන්සේගේ ප්‍රඥාව වන සේක. (1 කොරින්ති 1:24) උන්වහන්සේ සියල්ලට ප්‍රධානව සිටින සේක. (කොලොස්සි 1:18)

උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්න

කෙබඳු වූ ගැලවුම්කරුවෙක්ද ..? උන්වහන්සේගේ මහිමයට සීමාවක් නැත. උන්වහන්සේගේ බලයට සීමාවක් නැත. උන්වහන්සේගේ ප්‍රේමයට සහ හැකියාවට සීමාවක් නැත. අපට අවශ්‍ය සියල්ල උදෙසා උන්වහන්සේ සැහෙන සේක. උන්වහන්සේගේ පූර්ණත්වය අපගේ ජීවිතවල පූර්ණත්වයේ උල්පතයි. ඇත්ත වශයෙන්ම මේ සියල්ලට අවශ්‍යයවන්නේ අපි උන්වහන්සේ දෙස බලා සිට අපගේ සියලු අවශ්‍යතාවයන් සඳහා උන්වහන්සේව විශ්වාස කිරීමයි. ජීවනය, ප්‍රේමය, බලය ශුද්ධකම සහ අනෙකුත් සියලු දේ සඳහා උන්වහන්සේ දෙස බලා සිටින්න. "ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කිරීම කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වීම ආරම්භ කළ ආකාරයටම ජීවත්වෙන්න" කියා කෙනෙක් පවසා තිබේ.

යාච්ඤා කිරීම සහ සේවය කිරීම සඳහා බලය

"සැබෑවක්, සැබෑවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය. මා පියාණන් වහන්සේ ළඟට යන නිසා මිට වඩා මහත් ක්‍රියාත් කරන්නේය. නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත් පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමය ලබන පිණිස මම ඒක ඉෂ්ඨකරන්නෙමි. නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත් මම ඒක ඉෂ්ඨ කරන්නෙමි." (යොහාන් 14:12-14)

ගැලවුම්කරුවාණන් කන්ද උඩ දේශනාවේදී උන්වහන්සේගේ ගෝලයන් සමඟ උන්වහන්සේගේ ප්‍රසිද්ධ සේවය ආරම්භ කළ පරදි උන්වහන්සේ වෙන්ව යාමට ආසන්නව සිටියදී අපව ආරක්ෂා කර ගැනීම පිළිබඳව යොහාන් සුභාරංචියේ පහදා තිබේ. මේ අවස්ථා දෙකෙහිම උන්වහ්නසේ යාච්ඤාව ගැන කිහිප අවස්ථාවක්ම කථා කර ඇත. නමුත් මේ දෙකේ වෙනසක් ඇත. කන්ද උඩ දේශනාවේදී ගෝලයන් උන්වහන්සේගේ පාසලට ඇතුල්වූවා පමණක් බැවින් ඔවුන්ගේ පියාණන් වහන්සේ ගැන ඔවුන්ට යාන්තමින් අවබෝධ කරදෙනු ලබන අතර ඔවුන්ගේ යාච්ඤාව ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා ගැන සඳහන් කර ඇත. යොහාන් සුභාරංචියේදී උන්වහන්සේගේ ගෝලයන්ව පුහුණු කිරීමේ කාලය අවසානයකට පැමිණ ඇති බැවින් උන්වහන්සේගේ ස්ථානය සහ කාර්යයය භාර ගැනීමට උන්වහන්සේගේ පණිවිඩකරුවන් ලෙස සිටින ගෝලයන්ට කථා කරයි.

පළමු අවස්ථාව වන කන්ද උඩ දේශනාවේ දී ළමයෙක් මෙන් විශ්වාසයෙන් යාච්ඤා කළ යුතුය. එහිදී පියා යහපත් දේ ලබාදෙන බව විශ්වාස කළ යුතුය. මෙහිදී උන්වහන්සේ උසස් කාරණයක් පෙන්වා දෙන සේක. ඔවුන් දැන් උන්වහන්සේගේ මිතුරන් වන අතර පියාණන් වහන්සේ ගැන සියලු දේ ඔවුන්ට අවබෝධ කර දෙමින් උන්වහන්සේගේ පණිවිඩකරුවන් ලෙස උන්වහන්සේගේ සැලැස්මට ඇතුළත්වී ඇති බවත් දේවරාජ්‍යය පොළොවේ ව්‍යාප්ත කිරීම සඳහා උන්වහන්සේගේ කාර්යය ඔවුන්ට භාරදීමට නියමිත බවත් පවසන සේක. දැන් ඔවුන් පිටත්ව ගොස් උන්වහන්සේගේ කාර්යය ඉටුකිරීමටත්. උන්වහ්නසේ ලබාදෙන බලයෙන් ඊටත් වඩා විශාල කාර්යයන් කිරීමටත් නියමිතය. යාච්ඤා කිරීම ඔවුන්ගේ කාර්යය සඳහා එම බලය ලබා ගැනීමට ඇති මාධ්‍යය (මාර්ගය) විය යුතුය. යේසුස් වහන්සේ පියාණන් වහන්සේ වෙතට ඔසවා ගැනීමත් සමග ඔවුන්ගේ සේවය කිරීම සහ යාච්ඤා කිරීම යන දෙකටම නව යුගයක් ආරම්භ විය.

මෙම සම්බන්ධතාවය අපි අවධානය යොමු කරන බයිබල් පාඨයෙන් කොයිතරම් පැහැදිලිව පෙනෙනවාදැයි බලන්න. ශාරීරිකව උන්වහන්සේ පොළොවේ සිටියදී සහ උන්වහන්සේ ස්වර්ගයේ සිටින විට උන්වහන්සේ සමඟ සම්බන්ධව සිටින අය ලෙස දැන් ඔවුන් කලාට වඩා විශාල දේ කිරීමට නියමිතය. ඔවුන්ගේ සාර්ථකත්වය සහ ඔවුන්ගේ ජයග්‍රහණය උන්වහන්සේට වඩා විශාල විය යුතුය. ඊට හේතු දෙකක් උන්වහන්සේ සඳහන් කරන සේක. පළමුවන හේතුව නම්, යේසුස් වහන්සේ, පියාණන් වහන්සේ ළඟට යන නිසා සියලු බලය ලබාදෙන සේක. දෙවෙනි හේතුව වන්නේ දැන් සියලු දේ උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලා සිටීමට සහ බලාපොරොත්තුවීමට හැකිවීමයි.

මක්නිසාද මම පියාණන් වහන්සේ වෙතට ගොස් ඔබ ඉල්ලන සියල්ල ඉටු කරන්නෙමි. උන්වහන්සේ, පියාණන් වහන්සේ වෙතට යාමෙන් දෙගුණයක් ආශිර්වාද ලැබෙනු ඇත. එහි ප්‍රතිඵලය ලෙස මහත් දේ ඉටුකරනවා ඇත.

යේසුස් වහන්සේගේ වෙන්ව යාමට ප්‍රථම කරන ලද ප්‍රකාශය තුළ යාච්ඤාව ගැන අපට ඉතා වැදගත් පාඩම් දෙකක් උගන්වයි. යේසුස් වහන්සේගේ කාර්යය (සේවය) කරන්නා උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කළ යුතුය. උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන්නා උන්වහන්සේගේ නාමයෙන් සේවය කළ යුතුය.

(ඇන්ඩ්‍රෘ මරේ විසිනි) (1828-1917)

මහත් වූ කාරණා ඉටු කිරීමට බලය ලබා ගැනීම සඳහා යාච්ඤා කිරීම

උන්වහන්සේගේ කාර්යය කරන තැනැත්තා යාච්ඤා කළ යුතුය. සේවය සඳහා බලය ලබාගන්නේ යාච්ඤා කිරීමෙන්ය. යේසුස් වහන්සේ කළ ක්‍රියා ඇදහිල්ලෙන් කිරීමට කැමති තැනැත්තා උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කළ යුතුය. යේසුස් වහන්සේ පොළොවේ සිටින තෙක් මහත් ක්‍රියා කළේ උන්වහන්සේමය. ගෝලයන්ට දුරු කළ නොහැකි වූ යක්ෂයන් යේසුස් වහන්සේගේ වචන වලින් පලා ගියෝය. උන්වහන්සේ පියාණන් වහන්සේ වෙතට ගිය පසු කෙලින්ම සේවය කිරීමට උන්වහන්සේ තවදුරටත් ශාරීරිකව නොසිටිය සේක. ගෝලයන් දැන් උන්වහන්සේගේ ශරීරය විය. ස්වර්ගයේ සිංහාසනයේ සිට මේ පොළොවේ උන්වහන්සේගේ සියලු කාර්යයන් ගෝලයන් හරහා කළ යුතු අතර එය කළ හැකිය.

යම් අය සිතන්නට ඇත්තේ යේසුස් වහන්සේ දැන් එම ස්ථානයෙන් ඉවත්ව යන බවත් ගෝලයන් හරහා පමණක් සේවය කළ හැකි බවත්, සේවය හීනවී හා දුර්වල විය හැකි බවත්ය. යේසුස් වහන්සේ අපට ඊට ප්‍රතිවිරුද්ධව සහතික කරනු ලබයි. ***"සැබෑවක්, සැබෑවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය. මා පියාණන් වහන්සේ ළඟට යන නිසා මිට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය."*** (යොහාන් 14:12)

යේසුස් වහන්සේගේ මරණය ප්‍රවේශ වූයේ පාපයේ බලය බිඳ දැමීම සහ අවසන් කිරීමයි. නැවත නැගිටීමත් සමඟ සදාකාල ජීවිතයේ බලය වූයේ මනුෂ්‍යය ශරීරය අත්පත් කර ගැනීම සහ මිනිස් ජීවිතයට ඉහළින් ලැබෙන ආධිපත්‍යය ලබා

5 පිටුවට

4 පිටුවෙන්

යාච්ඤා කිරීම සහ සේවය ...

ගැනීමයි. උන්වහන්සේ ස්වර්ගයට නැගයාමත් සමඟ උන්වහන්සේට ශුද්ධාත්මයාණන් වහන්සේව සම්පූර්ණයේම සන්නිවේදනය කිරීමේ බලය ලැබුණු සේක. සිංහාසනය මත සහ පොළොවේ ඒකත්වය කොපමණ තියුණු සහ දිව්‍යමය වශයෙන් පරිපූර්ණ විය යුතු ද කියා උන්වහන්සේ වචනානුසාරයෙන්ම සහ සත්‍යය ලෙස අදහස් කළ සේක. "මම පියාණන් වහන්සේ වෙතට යන බැවින් මීට වඩා මහත් දේ කළ හැකිය.

එය කොයිතරම් සත්‍ය වූ කාරණයක් දැයි ඔප්පු විය. යේසුස් වහන්සේ වසර 03 ක් පොළොවේ පුද්ගලිකව සේවයේ යෙදී සිටියදී ගෝලයන් පන්සියයකට වඩා ස්වල්පයක් රැස්කරගත් අතර ඔවුන්ගෙන් වැඩි දෙනා දුර්වලව සිටියේය. එම නිසා උන්වහන්සේට ලැබෙන කීර්තිය (ගෞරවය) ඉතා කුඩාවීමට එය එක් හේතුවක් විය. නමුත් ප්‍රේත්‍රැස් පාවුල් වැනි මනුෂ්‍යයන් උන්වහන්සේ කළාට වඩා මහත් දේවල් කිරීමට බලය ලබාගත්තෝය. නින්දාව තුළ තමන් වහන්සේට තවමත් කළ නොහැකි වූ දේ ස්වර්ගයේ සිංහාසනයේ සිට ගෝලයන් හරහා කළ හැකි විය.

නමුත් එක කොන්දේසියක් තිබේ. මම පියාණන් වහන්සේ වෙතට යන බැවින් මා කෙරෙහි විශ්වාසය තබන්නා ඊට වඩා මහත් දේ කරන්නේය. නුඹලා මාගේ නාමයෙන් ඉල්ලන මොන දෙයක් වුවත් මම ලබා දෙන්නෙමි. යේසුස් වහන්සේ පියාණන් වහන්සේ වෙතට යාමෙන් යාච්ඤාවලට ඇහුම්කන්දීමට නව බලයක් උන්වහන්සේට ලැබෙනු ඇත. මහත් වූ ක්‍රියාවන් සිදු කිරීමට කාරණා දෙකක් අවශ්‍ය වේ. එනම් සියලු බලය ලබාදීමට යේසුස් වහන්සේ, පියාණන් වහන්සේ වෙතට යා යුතුය. එමෙන්ම නැවත උන්වහන්සේගෙන් සියලු දේ ලබා ගැනීමට යෙසුස් වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීම වේ. යේසුස් වහන්සේ, පියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටින පරිදි මහත් වූ ක්‍රියාවන් ඉටු කිරීමට අපට බලය ලබාදෙන සේක. අපි විශ්වාස කරන පරිදි සහ උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලා සිටින පරිදි මහත් වූ ක්‍රියාවන් කිරීමට බලය හිමිකරගනු ලබන්නෙමු.

මහත් වූ ක්‍රියාවන් ගැන කතා නොකර ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රියාවන් ගැන කථා නොකර ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රියා මෙන් ඕනෑම දෙයක් කිරීමට ඇති බලය සුළු වශයෙන් පෙනීම හෝ කිසිවක් නොපෙනෙන විට දෙවියන් වහන්සේගේ සේවයේ ක්‍රියාවන් ඉටු කරන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට උන්වහන්සේව විශ්වාස කරමින් උන්වහන්සේ තුළ යාච්ඤා කිරීම බෙහෙවින්ම අවශ්‍ය වන්නේය. සභාව තුළ හෝ පාසල තුළ සෑම නායකයෙක්ම සහ සේවකයෙක්ම නිවසේ පරාර්ථකාමී බව (ත්‍යාගවන්තකම) ගැන හෝ පිටස්තර ආගන්තුක සේවාවන් පිළිබඳව ඉගෙන ගන්නවා විය හැකිය. යේසුස් වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීම පියාණන් වහන්සේ තම සෙනඟ වෙනුවෙන් ලබා දී ඇති බලවත් බලය බෙදා ගැනීමේ මාර්ගය වන අතර විශ්වාස කරන්නන්ට වඩාත් බලවත් වූ මහත් ක්‍රියාවන් කළ හැකි වන්නේ මෙම බලය තුළ පමණි.

දුර්වලකම්වලදී හෝ නුසුදුසුකම්වලදී දුෂ්කරතාවලදී හෝ අවශ්‍යතාවලදී කරන්නා වූ සෑම අයැදීමකටම යේසුස් වහන්සේ මෙම එක පිළිතුරක් ලබාදෙන සේක. **"මා කෙරෙහි විශ්වාස කරන්නා මා කරන ක්‍රියාත් කරන්නේය."** යේසුස් වහන්සේගේ කාර්යය කරන සෑම කෙනෙකුගේම පළමුවන හා ප්‍රධානතම කාරණය නම් විශ්වාස කිරීමත් ඒ තුලින් සර්වබලධාරී දෙවියන් වහන්සේට සම්බන්ධවීමත්, යේසුස් වහන්සේගේ නාමයෙන් ඇදහිල්ලෙන් යාච්ඤා කිරීමත් බව අපි තේරුම් ගත යුතුය. මෙය කරන්නේ නැති නම් අපගේ කාර්යය මාංශික හා ලෞකික වන්නේය. පාපය වැළැක්වීමට හෝ ආශිර්වාදය සඳහා මාර්ගය සකස් කිරීමට එයින් යම් ප්‍රමානයක් තිබිය හැකි නමුත් සැබෑ බලය අවශ්‍ය වේ. ඵලදායීව සේවය කිරීම සඳහා පළමුව ඵලදායීව යාච්ඤා කිරීම අවශ්‍යව තිබේ.

ඔබගේ ජීවිතය උන්වහන්සේගේ සේවයට භාරදෙන්න.

දැන් දෙවන කාරණය වෙත අවධානය යොමු කරමු. යාච්ඤා කරන තැනැත්තා සේවය කළ යුතුය. යාච්ඤාව සඳහා මහත් වූ පොරොන්දුව වී ඇත්තේ සේවය කිරීමට බලය ලැබෙන බවයි. ඇදහිල්ලේ ඵලදායීව යාච්ඤාව සඳහා බලය ලැබෙන්නේ සේවය ඉටුකරන ආකාරයට වේ. අපගේ ආශිර්වාදලත් ස්වාමීන් වහන්සේගේ වෙන්වයාමේ වචනවලදී අවස්ථා කිහිපයකම එම අසීමිත යාච්ඤාවේ පොරොන්දු පිළිබඳව නැවත නැවත ප්‍රකාශ කළ බව අපට දැකිය හැකිය. (යොහාන් 14:13-14, 15:7, 15:16, 16:23-24) ඇදහිලිවන්තයන් අතරින් කී දෙනෙක් ප්‍රීතියෙන්, බලාපොරොත්තුවෙන් සහ ආත්මයේ දැඩි උනන්දුවකින් මේවා කියවමින් ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කන්නලව් කිරීමට යොමු වන්නට ඇද්ද ..? උන්වහන්සේ ඉවත්ව ගොස් සිටින සේක. ඊට සරල හේතුව මෙයයි. උන්වහන්සේ පොරොන්දුව ඉටු කිරීම උදෙසා ඉවත්වගොස් සිටින සේක.

යේසුස් වහන්සේ, උන්වහන්සේගේ කාර්යයන් ඉටු කිරීමට පියාණන් වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතිව උන්වහන්සේගේ නාමය නොමිලේ භාවිතා කිරීමේ පුදුමුකාර පොරොන්දුව ස්වාමීන් වහන්සේ අපට ලබා දුන් සේක. යේසුස් වහන්සේගේ රාජ්‍යය සහ සේවය වෙනුවෙන්, උන්වහන්සේගේ කැමැත්ත සහ ගෞරවය වෙනුවෙන් ජීවත්වීමට තමාව සම්පූර්ණයෙන්ම කැප කරන්නේ ගෝලයන් වන අතර පොරොන්දුව හිමිකර ගැනීමට බලය ලැබෙන්නේ කාටද ? තමාට විශේෂ දෙයක් අවශ්‍ය වූ විට පොරොන්දුව ග්‍රහණයකර නොගන්නා තැනැත්තා කළකිරීමට පත්වනු ඇත. මක්නිසාද ඔහු යේසුස් වහන්සේව තම සැනසිල්ලේ ස්වාමියා බවට පත්කරගෙන නැත. නමුත් ඇදහිල්ලේ ඵලදායී යාච්ඤාවේ යාච්ඤා කිරීමට එය ස්වාමියාගේ කාර්යය සඳහා අවශ්‍ය බැවින් ඔහුට තම ස්වාමියාගේ අවශ්‍යතාවයන්වල සේවකයෙකු බවට තමාව පත්කර ඇති බව ඉගෙන ගැනීමට හැකියාව ලබාදෙන සේක. යාච්ඤා කිරීම සේවය කිරීමට උගන්වනවා සහ ශක්තිය ලබාදෙනවා පමණක් නොව සේවය කිරීම යාච්ඤා කිරීමට උගන්වමින් ශක්තිය ලබාදෙයි.

මෙය ස්වභාවික සහ ආත්මික ලෝකයේ යහපත් දේ සමඟ පරිපූර්ණ එකඟතාවයකින් යුක්තවේ. යමෙකුට ඇත්නම් ඔහුට දෙනු ලැබේ. එසේ නැතිනම් ස්වල්පයක් ගැන විශ්වාසව සිටින්නා බොහෝ දේ ගැනද විශ්වාස කරයි. මේ වන විටත් ලැබී තිබෙන්නා වූ කරුණාවේ ප්‍රමාණය සමගින් ස්වාමීන් වහන්සේගේ කාර්යය සඳහා අපගේ ජීවිත ලබාදෙමු. සේවය අපට යාච්ඤාවේ සැබෑ පාසලක් වනු ඇත. කැරලිකාර සෙනඟක් පිළිබඳ සම්පූර්ණ වගකීම මෝසෙස්ට පැවරීමට සිදු වූ විට දෙවියන් වහන්සේට නිර්භීතව කථා කිරීමටත් උන්වහන්සේගෙන් මහත් දේ ඇසීමටත් අවශ්‍යතාවය පමණක් නොව ධෛර්යයද දැණුනේය. (නික්මයාම 33:12, 15, 18) ඔබ දෙවියන් වහන්සේගේ කාර්යය සඳහා සම්පූර්ණයෙන්ම ඔබව භාරදෙන විට මෙම උතුම් වූ පොරොන්දුවලට වඩා අඩුවෙන් කිසිවක් ඔබට අවශ්‍ය නොවන බව ඔබට හැගෙනවා ඇත. ඔබ වඩාත් විශ්වාසයෙන් බලාපොරොත්තු විය හැකි කිසිවක් අඩුනොවේ.

යේසුස් වහන්සේව ඇදහීමටත්, යේසුස් වහන්සේ මෙන් ක්‍රියා කිරීමටත්, ඊටත් වඩා මහත් දේවල් කිරීමටත් ඔබව කැඳවා පත්කරනු ලැබූ සේක. මන්ද උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුලින් ඒවා ඉටු කිරීමට බලය ලබා ගැනීමට, පියාණන් වහන්සේ වෙතට (ස්වර්ගයට) ගොස් ඇති බැවිනි. ඔබ මාගේ නාමයෙන් ඉල්ලන ඕනෑම දෙයක් මම කරන්නෙමි.

ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රියා කිරීමට ඔබගේ ජීවිතය භාර දෙන්න. ඒ උදෙසා ජීවත් වෙන්න. එවිට ඔබ යාච්ඤාවට පුදුම වූ පිළිතුරු ලබා ගැනීමට ඉගෙනගන්නවා ඇත. ඔබගේ ජීවිතය උන්වහන්සේට භාර දෙන්න. උන්වහන්සේ උදෙසා ජීවත්වෙන්න. යාච්ඤා කරන්න එවිට ඔබ උන්වහන්සේ කළ දේවල් සහ ඊට වඩා මහත් දේවල් කරනු ලබනවා ඇත. උන්වහන්සේ තුළ ඇදහිල්ලෙන් පූර්ණ වූ ගෝලයන් නිර්භීත ලෙස යාච්ඤා කර මහත් දේ කරමින් ලෝකය ජයගන්නවා ඇත.

පසුතැවිලිවීම, පවිත්‍ර කිරීම සහ ක්‍රිස්තුස් වහන්සේට කැප කිරීම

ඇදහිලිවන්තයන්ට ඔවුන්ගේ ජීවිත තුළ ආත්මයේ පූර්ණත්වය නොමැති විය හැකි කෙසේද සහ ඒ කාරණා වලින් ජය ගන්නේ කෙසේද කියා පහත සඳහන් කරුණු වලින් පෙන්වා දෙනු ලබයි.

මට ආත්මයේ පූර්ණත්වය නැත්තේ ඇයි? ඊට හේතු දෙකක් තිබේ. ඉන් පළමුවැන්න අපේ නොදැනුවත්කමයි. ක්‍රිස්තුස් වහන්සේ තුළ අපට දේවත්වයේ පූර්ණත්වය හිමිවන අතර ආත්මයාණන් වහන්සේ තුළ මෙම සම්පූර්ණත්වය අපට පුද්ගලිකව හිමිවන දෙයක් බවට පත්කරන සේක. එහෙත් දෙවියන් වහන්සේගේ වචනය නොදැනුවත්කම නිසා අපට මෙම අවබෝධය නැතුව සිටිති. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපට පූර්ණත්වය පිළිබඳව අත්දැකීමක් නොමැත.

අනිත් හේතුව අවිශ්වාසයයි. අපි සත්‍යතාවය දන්නේ බුද්ධිමය හා ධර්මානුකූලව පමණි. එය

(රැක් පැක්සන් විසිනි) (1889 - 1949)

හදවතේ අත්දැකීමක් වී නොමැත. නැතිනම් එය අපි දන්නා නමුත් අපගේ දැනගැන්ම මත ක්‍රියාකිරීමට සහ ඇදහිල්ලෙන් මෙම ආශිර්වාදය ලබා ගැනීමට අපි බිය වන්නෙමු. **"මෙසේ නොඇදහිලිකාර්කම නිසා ඔවුන්ට ඇතුල්වෙන්ට නුපුළුවන් වූ බව අපට පෙනෙන්නේය."** (හෙබ්‍රෙව් 3:19)

6 පිටුවට

5 පිටුවෙන්

පසුතැවිලිවීම, පවිත්‍ර කිරීම...

පාපය සමඟ කටයුතු කිරීම

අත්දැකීමෙන් මෙහි කරුණු දෙකක් පවතින බව පෙන්නේය. එකක් නම් පසුතැවිලි නොවූ පාපයයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ශුද්ධව සිටින බැවින් උන්වහන්සේ වාසය කරන ස්ථානය ශුද්ධව තබාගත යුතුය. මෙම ශුද්ධකමෙන් පූර්ණවීමට පාපයෙන් පවිත්‍ර වන ලෙස ඉල්ලා සිටින සේක. නොදැනුවත්ව හෝ හිතාමතාම ජීවිතය තුළ පාපය රඳවාගැනීම නිසා දෙවියන් වහන්සේගෙන් පූර්ණවීමට නොහැකිය.

2 ලේකම් 29 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි හෙසකියා රජු යටතේ ඇති වූ පුදුමාකාර පිඹීදීම අතරතුර දේවමාළිගාව පවිත්‍ර කිරීම දෙවියන් වහන්සේ අපෙන් ඉල්ලා සිටින පවිත්‍ර කිරීමේ ආකාරය හා ප්‍රමාණය අපට පෙන්වයි. "ඔවුන්ට කථාකොට ලෙවීවරුනි මට ඇහුම්කන් දියල්ලා. නුඹලාම ඉන් පවිත්‍ර වී නුඹලාගේ පියවරුන්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ ගෘහයත් පවිත්‍රකොට ශුද්ධස්තානයෙන් කිලුටුකම පහාකරපල්ලා" (2 ලේකම් 29:5)
"සූජකයෝ ස්වාමීන් වහන්සේගේ ගෘහය පිරිසිදු කරන පිණිස එහි ඇතුළට ගොස් ස්වාමීන් වහන්සේගේ මාළිගාවෙහි සම්බවුණ සියලු කිලුටු දේ ස්වාමීන් වහන්සේගේ ගෘහයේ මළුවට ගෙනාවෝය. ලෙවීවරු ඒවා කිදොන් ඩයට ගෙන යන පිණිස අරගත්තෝය. ඔවුහු පළවුවෙනි මාසයේ පළවුවෙනිදා පවිත්‍ර කරන්ට පටන්ගෙන මාසයේ අටවෙනිදා ස්වාමීන් වහන්සේගේ ද්වාර මණ්ඩපයට ආවෝය. අට දවසකින් ඔවුහු ස්වාමීන් වහන්සේගේ ගෘහය පවිත්‍ර කර පළවුවෙනි මාසයේ දහසය වෙනිදා නිම කළෝය." (2 ලේකම් 29:16-17)

අපවිත්‍රකම (අපිරිසිදුකම) යන වචනය ගැන ඔබ අවධානය යොමු කළාද ? පාපය ගැන කථා කරන විට දෙවියන් වහන්සේගේ මෘදු හැඟීම්බර වචන භාවිතා නොකරන සේක. උන්වහන්සේ අපවිත්‍රකම හඳුන්වා දෙනු ලබන්නේ කෙසේදැයි බලන්න. ශුද්ධස්ථානයේ අපවිත්‍රකම ලෙස එය හඳුන්වා දෙන සේක. දේව මාළිගාව විශේෂයෙන් පවිත්‍ර කිරීමට අණකිරීමට රජුට සිදුවන තරමට ශුද්ධස්ථානයේ අපවිත්‍රකමක් එකතුවූයේ කෙසේද ? ඔවුන් දේව මාළිගාවේ පිටත මලුවෙන් ආරම්භකර පවිත්‍ර කිරීම එයින් නතර නොකර දේවමාළිගාවේ ඇතුල් කොටස පවිත්‍ර කිරීමට ඇතුල් වූ බවත් අවධානය යොමු කර බලන්න. ඔවුන් නිකම්ම පිරිසිදු නොකර අපවිත්‍ර දේවල් පිටතට ගෙනා අතර ඔවුන් සමහර අපවිත්‍රකම් පමණක් නොව සියලුම අපවිත්‍ර දේ පිටතට ගෙනාවේය එය ඉතාමත් හොඳින් සිදු කරන ලද දේවගෘහය පවිත්‍ර කිරීමකි. එය ඉටු කිරීමට ඔවුන් කොපමණ කාලයක් වැය කළාද ? නිශ්චිත වශයෙන් දින දහසයකි. අපවිත්‍ර දේ අයින් කිරීමට කොපමණ මහත් ලෙස ක්‍රියා කිරීමක්ද ..? නමුත් ඔවුන් පසුබට නොවී එය අවසානය තෙක් ඉටු කළේය.

දැන් අපි මෙම ස්වභාවයේ සත්‍යතාවය දකින පිණිස අළුත් ගිවිසුම වෙතට හැරෙමු. ඒ ආකාරයෙන්ම ඒ හා සමාන වචනම භාවිතා කරමින් ඉගැන්වීම අපට අනාවරණය කරගත හැකිය. **"නුඹලා දෙවියන් වහන්සේගේ මාළිගාව බවද දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද ..? යමෙක් දෙවියන් වහන්සේගේ මාළිගාව නාස්ති කරන්නේ නම් දෙවියන් වහන්සේ ඔහුව නාස්ති කරන සේක. මක්නිසාද දෙවියන් වහන්සේගේ මාළිගාව ශුද්ධය. ඒ මාළිගාව නුඹලාය. "**(1 කොරින්ති 3:16-17) **"එබැවින් ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා මාංසයේද, ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපව පවිත්‍රකර ගනිමින් දෙවියන් වහන්සේ කෙරෙහි බියෙන් යුක්තව ශුද්ධකම සම්පූර්ණකර ගනිමු."** (2 කොරින්ති 7:1)

ඔබ දෙවියන් වහන්සේගේ මාළිගාවයි. දේව මාළිගාව ශුද්ධව පැවතිය යුතුව ඇත. එබැවින් එය මාංසික සහ ආත්මික යන අංශ දෙකේම සියලුම නොදැනුවත්කමින් පවිත්‍ර විය යුතුය. අතීතයේ ජීවිතය තුළ දරුණු කාමුක අශිෂ්ඨ පාපයන් පවා තිබෙන්නට ඇත. සමහරවිට දැන් එම දරුණු මාංසික පාපවලින් මිදී සිටින්නට ඇත. නමුත් අපගේ ආත්මයේ ඇතුලාන්තයේ තවමත් අපවිත්‍රව තිබෙන දේවල් ගැන අපි කරන්නේ කුමක්ද ..? අතීතයේ දී අපි බොරු කියූ නමුත් දැන් අපි හිතාමතාම එළිපිට බොරු කියන්නේ නැත. නමුත් කුහකකම, වංචාව, ද්වේත්ව ගණුදෙනු අප තුළ පවතින්නේය. අපගේ කිතුණු අත්දැකීම්වල පවා ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමීත්වය අප සමඟ ඇති බවට සාක්ෂි ප්‍රකාශ වන්නේ නැත.

ඉස්සර අපට දරුණු තරහක් තිබුණා. ඒකට අපි නිතරම ඉඩ දුන්නා. දැන් පිටතින් පවතින කෝපය විශාල ප්‍රමාණයකින් පාලනය කරගෙන තිබේ. නමුත් ආත්මය තුළ එම රහසිගත කෝපය සහ නොඉවසිලිවන්තකම ගැන කුමක් කිව හැකිද ..? වරක් අපි අවංකව හා විවෘතව යමෙකුට වෛර කර එසේ කීවෙමු. දැන් එය අපට පාපයකි. නමුත් වෛරය ඇති කළ ඊර්ෂ්‍යාව හෝ අමනාපය තවමත් හදවතේ අඳුරු කොනක සැඟවී තිබේද .. ? අපි ඉස්සර වගේ කෙනෙක් එක්ක එළිපිට රණ්ඩු නොවන්නෙමු. නමුත් අපි අකමැති කෙනෙක් දැක්කොත් ඒ කෙනාව මගහැර යන පිණිස පාරේ අනිත් පැත්තට මාරු වන්නෙමු. එමෙන්ම අපි සිතන්නේ අපි ජයග්‍රාහී ආත්මික කිතුණුවන් බැවින් අපට පවිත්‍රවීමක් අවශ්‍ය නැති බවයි.

වරක් මම මිෂනාරී සේවයේ රැස්වීම් මාලාවක් ගැනීමට බාලිකා පාසලකට ගියෙමි. එක් මිෂනාරීවරියක් මා වෙතට පැමිණ මේ ගැහැණු ළමයින් අතරේ පුද්ගලික වැඩ කිසිවක් කිරීමට මට කියන්න එපා. මන්ද මට එය කල නොහැකියි කියා කීවාය. ඇය තවදුරටත් කියා සිටියේ මගේ සෞඛ්‍ය තත්ත්වය නිසා මම නිවාඩු ගෙන ගෙදර යනවා. ආපසු එන්නේ නැහැ කියා මාගේ සහකාර සේවකයන්ට පවසා තිබෙනවා කියාය. ඇගේ සෞඛ්‍යය තත්ත්වය පිරිහෙමින් තිබුණු බව සත්‍යයකි. නමුත් සෞඛ්‍ය තත්ත්වය බිඳවැටීමට හේතුව භෞතික එකක් නොව අධ්‍යාත්මික එකකි. මම බයිබලයෙන් ජයග්‍රහණය පිළිබඳ පද උපුටා දැක්වීමට පටන් ගතිමි. ඇයට ඒ හැම එකක්ම කඩ පාඩමින් පැවසිය හැකි විය. මම ජයග්‍රහණය පිළිබඳ පොත් ගැන කථා කළෙමි. ඇය ඒවා සියල්ලම දැන සිටි අතර ඒවායින් බොහෝමයක්ම කියවා තිබුණි. ජයග්‍රහණයේ මූලධර්ම සහ වාක්‍යකණ්ඩ ඇයට යටපත් කරන ලද මාංශයේ යම් මහත් පාපයක් තිබුණාදැයි ඔබ අසනවා ඇත. නැත. නමුත් වසර හතරකට පෙර ඇගේ හදවතේ ගැඹුරට කිදා බැසීමට ඉඩහැර තිබූ කුඩා වේදනාවක් ඇගේ හදවතේ සාමය, බයිබලය අධ්‍යනය කිරීමෙන් සහ යාච්ඤාවෙන් හටගන්නා වූ ඇගේ ප්‍රීතිය, නැති වූ ආත්ම කෙරෙහි ඇති ආශාව සොරකම් කරන තෙක් ඇය පෝෂණය කළාය. ඊටත් වඩා එය ඇයව ශාරීරික රෝගී තත්ත්වයට පත්කර අවසානයේ දී නැවත ඇයව ධර්මදූත මෙහෙවරට නොපැමිණෙන ලෙස නිවසට රැගෙන ගියේය. සැඟවුණා වූ කුඩා වේදනාවක් මනුෂ්‍යයෙකුට එලෙස හානිකර තිබුණේය.

ස්විට්සර්ලන්තයේ පැවති සම්මන්ත්‍රණයකදී පැසුණු හිසකෙස් ඇති පුද්ගලයෙක් එක් දේවමෙහෙයක් අවසානයේ දී ප්‍රසිද්ධ පාපොච්චාරණයක් කළේය. වසර විසිහතක් තිස්සේ තම ඥාතීන් සමඟ කිසිදු සම්බන්ධතාවයක් ඔහුට නොතිබුණි. වසර ගණනාවක් නින්ද නොයාමෙන් ඔහු පීඩා වින්දේය. මෙම දේව මෙහෙයෙන් පසු පසුතැවිලිවීමෙන් හා පවිත්‍රවීමෙන් පසුව ඔහු ළදරුවෙකු මෙන් නිදාගත්තේය. පසුගිය දින තුනේදී මෙන් සාමයක් අවුරුදු විසිහතක් ඔහුගේ සිතේ නොතිබූ බව ඊළඟ සබත් දවසේ දී ඔහු සාක්ෂි දුන්නේය. **"අපේ පාපවල් කියාදෙවු නව්, අපේ පව් අපට කමාකරන්නටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්නටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක."** (1 යොහාන් 1:9) **"තමාගේ වචද සඟවන්නා සවල නොවන්නේය. එහෙත් ඒවා කියාදී අත්හරින්නට කරුණාව ලැබේ. "** (හිතෝපදේශ 28:13)

අපි යම් කෙනෙකු සමඟ අමනාපයේ හෝ සිත් රිදවීමේ හෝ ආදරය නොකිරීමේ හෝ ක්‍රිස්තුස් වහන්සේට එකඟ නොවන හැඟීමක් වැනි කුඩා ගිණි පුපුරක් පවා අල්ලාගෙන සිටින්නේ නම් අපගෙන් කිසිවෙකු ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම සඳහා යාච්ඤා කිරීම සම්පූර්ණයෙන්ම අනුවන සහ නිශ්ඵල ක්‍රියාවකි. අපි නිශ්ඵල ලෙස යාච්ඤා කරන්නෙමු. ආත්මයේ සහ මාංශයේ යන අංශ දෙකේම ඇති අපවිත්‍රකම් ඔබගේ ජීවිතයෙන් ඉවත් කිරීමට ඔබ කැමතිද ..? පිරිසිදු කිරීම යනු පිරවීම නොවේ. නමුත් එය සම්පූර්ණත්වය වළක්වන දේවලින් අපව ඉවත්කර අපව ඒ සඳහා සූදානම් කරනු ලබයි.

ඵලදායී ජීවිතයක්

පූර්ණත්වය නොමැතිකමට දෙවන හේතුව වන්නේ නොනැසුනාවූ ජීවිතයයි. එයින් අදහස් කරන්නේ කුරුසියේ ඇණ නොගැසූ පාලනය කළ නොහැකි ආත්මයකි. පූර්ණවීමෙන් ඉල්ලා සිටින්නේ අපි සම්පූර්ණයෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමීත්වයට යටත්වීමයි. එය වෙන්කිරීම්වලට ඉඩ නොදෙයි. එය අඟුළු දැමූ දොරවල්වලට ඉඩ නොදෙයි. ක්‍රිස්තුස් වහන්සේගෙන් නොවන සෑම මූලාශ්‍රයකින්ම අප වෙන්විය යුතු අතර සියල්ල ක්‍රිස්තුස් වහන්සේගේ පාලනය යටතේ තැබිය යුතුය. තමාගේම පාලනය පහකර දමා ක්‍රිස්තුස් වහන්සේගේ පාලනයට ස්වේච්ඡාවෙන් ඉඩ ලබාදිය යුතුය.

හෙසකියා රජුගේ කාලයේ ඇති වූ පිඹීදීමේදී දේවමාළිගාව පවිත්‍ර කිරීම අපි දකින්නෙමු. ඔවුන්ගේ ජීවිත, ඔවුන්ගේ යාග පූජාවන්, ස්තුති පූජාවන් කැප කරමින් ඔප්පු කළ ආකාරය අපි දකින්නෙමු. **"එවිට හෙසකියා කථාකොට දැන් නුඹලාව ස්වාමීන් වහන්සේට කැපවී සිටින බැවින් ළංවී යාගද ස්තුති පූජාද ස්වාමීන් වහන්සේගේ ගෘහයට ගෙනෙල්ලා යයි කීවේය. සභාව යාගද, ස්තුති පූජාද කැමති සියල්ලෝ දවන පූජාද ගෙනාවෝය."** (2 ලේකම් 29:31) අපවිත්‍රකම් පහකළාට පසුව පූජාවන් ගෙන එනු ලැබූවෝය.

දෙවියන් වහන්සේගේ මාළිගාව වන කිතුණුවෙකුගේ ජීවිතය පවිත්‍ර කිරීම හා කැපකිරීමේ දිව්‍යමය නියෝගය මෙයයි. "ශුද්ධත්වයේ සම්පූර්ණත්වය" , මාංශයේ සහ ආත්මයේ සියලු අපවිත්‍රකමින් පවිත්‍රකිරීම අනුගමනය කරයි. මෙය පැමිණෙන් අපගේ ශරීර ජීවමාන යාගයක් ලෙස ස්වාමීන් වහන්සේට හිමිකර දෙමින් උන්වහන්සේගේ සම්පූර්ණ පාලයට සහ පරිහරණයට භාරවීමෙනි. **"එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන්, ජීවමානවූ, ශුද්ධ වූ, දෙවියන් වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවන් නිසා නුඹලාගේන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා වේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන් වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වූ සම්පූර්ණ වූ දෙය කුමක් ද කියා දැනගන්නා පිණිස සිත අලුත්කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා."** (රෝම 12:1-2) **"උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරෙණේ, ජීවත්වෙන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී ඔවුන් වෙනුවට මැරී නැවත නැඟිටුණා වූ තැනැත්තාණන්සේ උදෙසා ජීවත්වන පිණිසය කියාත් අපි නිශ්චයකොට කියමුව."** (2 කොරින්ති 5:15)

ක්‍රිස්තුස් වහන්සේට යටත්වීම ලෙස සඳහන් කරන්නේ ක්‍රිස්තුස් වයන්සේගෙන් ජීවිතයේ සෑම අංශයක්ම මුළුමනින්ම පූර්ණවීමයි. අපගේ ජීවිත යම් දෙයකට විවෘත කරන විට එයින් අපගේ ජීවිත පිරීයයි. මම මගේ ජීවිතයේ පැවැත්ම සාතන්ට, ලෝකයට සහ මාංශයට යම් ප්‍රමාණයකින් විවෘත කරනු ලබන්නේ නම්, ඒවායින් මගේ ජීවිතයේ ඊට ඉඩහරිනු ලබන මට්ටමට පුරවනු ලබයි. නමුත් මම ක්‍රිස්තුස් වහන්සේට, ආත්මයාණන් වහන්සේට, දේව වචනයට මාගේ ජීවිතයේ ඉඩ ලබාදෙන්නේ නම් ඒවායින් මාගේ මනස, හදවත සහ මාගේ ආත්මය පුරවනු ලබන සේක.

7 පිටුවට

6 පිටුවෙන්

පසුතැවිලිවීම, පවිතු කිරීම...

ඵලදායි බව පූර්ණවීම නොවේ. නමුත් එය ඒ සඳහා සූදානම්වීමයි. අප හිස්වන විට පුරවන ලැබීමට සූදානම් වන්නේය. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පුරවනු ලැබිය හැකිවන්නේ යටහත් වුනා වූ ජීවිතයක් පමණි. ඔබ ඔබගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේට යටත් කර දී තිබෙනවාද ..?

ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණ පිපාසය නිවාගන්න.

සම්පූර්ණත්වය ලබාගත හැකි වන්නේ කෙසේද ..? මාර්ගය ඉතා සරල නමුත් මනුෂ්‍යයා සමහර විට එය සංකීර්ණ කරනු ලබයි. දෙවියන් වහන්සේගේ මාර්ගය කුමක්ද ..? උන්වහන්සේගේ වචනවලට සවන් දෙන්න. **"නුවුන් මා දෙන වතුරෙන් බොන කවරෙකුට නමුත් කිසිකලෙක පිපාසා නොවන්නේය. මා ඔහුට දෙන වතුර ඔහු තුලෙහි සදාකාල ජීවනය නික්මවන්නා වූ වතුර උල්පතක් වන්නේ යයි කී සේක."** (යොහාන් 4:14) එය ලබා දී තිබෙන්නා වූ තෑග්ග ක්‍රියාකාරීව අත්පත් කර ගැනීමයි. **"මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වවින් යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ."** (යොහාන් 7:37)

මෙය සරල දෙයක් විය හැකිද ..? මෙම වචන තේරුම් ගැනීමට කෙනෙකුට විශාල ශබ්ද කෝෂයක් හෝ විවරණයක් ලබාගත යුතු නැත. ඒවා ඔබගේ එදිනෙදා වචන මාලාවේ කොටසකි. එය ඉතා සරල නිසා අපට මගහැරී ඇත. ඕනෑම මනුෂ්‍යයෙක් දෙවියන් වහන්සේ සමඟ ප්‍රියමනාප නොමැත. දෙවියන් වහන්සේ ඔනෑම මනුෂ්‍යයෙක් කියා පවසන විට උන්වහ්නසේ ඔබේනමින්ම සඳහන් කර ඇත. යම් කෙනෙක් යනු ප්‍රකාශ කරනු ලබන කොනදේසි සපුරාලන තැනැත්තා යන්නයි. එම කොන්දේසි මොනවාද ?

"පිපාසය" මෙය මා සතුව නැති දෙයක් සහ මා සතුව තිබිය යුතු යැයි මට නොපැහැදිලි ලෙස හැගෙන දෙයකට ඇති ආශාවක් හෝ ඊර්ෂ්‍යාවෙන් හටගත් කාරණයක් නොවේ. සමහර විට ආත්මයෙන් පිරුණු ජීවිතයක දකින්නට ලැබෙන බලය සඳහා මෙම ආශාව අවශ්‍යයවේ. පිපාසය යනු ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ශුද්ධකම වෙනුවෙන් ඇති දැඩි ආශාවන වන අතර එය තෘප්තිමත් විය යුතුය. උන්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට සහ නැති වී සිටින ආත්ම උන්වහන්සේ වෙතට දිනා ගැනීමට බලය සඳහා දැඩි ආශාවකි. පිපාසය යන වචනය තුළ මීටත් වඩා යමක් ඇතුළත් වේ. එය දෙවියන් වහන්සේ ගැනම තෘප්තිමත් නොවූ ආශාවකි. අතීතයේ සිටි ගීතිකාකරුගේ හදවතේ මොර ගැසීම මෙයයි. **"දෙවියන් වහන්ස.. , වුවා දිය දොලවලට ඉතා අශාවන්නාක් මෙන් මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා ආශා ඇත්තේය. දෙවියන් වහන්සේ කෙරෙහි එනම් ජීවමාන දෙවියන් වහන්සේ කෙරෙහි මාගේ ආත්මය පිපිසාවේ. මම කවදා ඇවිත් දෙවියන් වහන්සේ ඉදිරියෙහි පෙනෙමි ද ..?"** (ගීතාවලිය 42 :1-2) යම් කෙනෙක් මෙලෙස ලියනු ලැබීය. මම උන්වහන්සේට සහ උන්වහන්සේගේ ශුද්ධකමට නොසන්සිදෙන පිපාසයෙන් සිටිමි. ඔබට මෙවැනි පිපාසයක් තිබෙනවාද ? පූර්ණත්වය ලබාගැනීම සඳහා පළමුවන කොන්දේසිය එයයි. ඊළඟට කුමක්ද ?

"එන්න" කොහේටද ..? කවුරුන් වෙතටද ..? සම්මන්ත්‍රණයකට හෝ යම් මනුෂ්‍යයෙක් හෝ මනුෂ්‍ය නායකයෙක් වෙතටද ..? "මා වෙතට එන්න". මෙම දීමනාව ලබාදිය හැකි එකම තැනැන්වහන්සේ මෙම ජීවමාන ජලය සම්පූර්ණයෙන්ම ලබාදෙන්නා වන සේක. ඔබ උන්වහන්සේ වෙතට පැමිණ තිබේද .? සමහර විට ඔබ ඇවිත් මෙම දීමනාව ඉල්ලා ඇති. නමුත් එය උන්වහන්සේ බලාපොරොත්තු වන තත්ත්වය නොවේ. උන්වහන්සේ එය පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙන සේක. ඉල්ලා සිටීම පිපාසය සමඟ බැඳී පවතියි. නමුත් අභිලාෂය ඉල්ලීමෙන් පවා ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් නොවේ. අපට තවත් දෙයක් කරන්නට තිබේ.

"බොන්න" මෙය ක්‍රියාවකි. අභිලාෂය (ප්‍රාර්ථනාව) අත්පත්කර ගැනීමක් වන්නේය. මට වතුර වුවමනායි. පානය කිරීම ක්‍රියාවක් බැවින් මම වතුර ගත යුතුයි. බොහෝ උනන්දුවෙන් සොයන ආත්ම ඇති අය අසාර්ථක වන්නේ මෙතැනදීය. මහිමාන්විත අත්දැකීම අඩුවන්නේ මෙතනදීය. ඔවුන්ට පිපාසය ඇති නමුත් ඔවුන් බොන්නේ නැත. **"වුද්‍රකපානයෙන් මත්නොවෙල්ලා. එයින් අනාචාරකම් හටගන්නේය. නමුත් ආත්මයාණන්ගෙන් පූර්ණ වී....."** (එපීස 5:18) යම් කෙනෙක් මත්වන්නේ කෙසේද ..? පානය කිරීමෙනි. ඔහු බීමත්ව සිටින්නේ කෙසේද ..? නොකඩවා පානය කිරීමෙනි. යමෙක් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටින්නේ නම් එසේ පිරී ඇත්තේ කෙසේද ..? ජීවමාන ජලය පානය කිරීමෙන් බව අපගේ ස්වාමීන් වහන්සේ පැවසූ සේක. යම් කෙනෙක් නොකඩවා පිරී සිටින්නේ කෙසේද ..? දවස් පතා නොකඩවා යාච්ඤා කිරීමෙනි.

ඔබට පිපාසය ඇතිවී දැන් පානය කිරීමට අවශ්‍ය නම් ඔබ දෙවියන් වහන්සේට මෙම සරල යාච්ඤාව කරන්න. ස්වාමීනි .... මට පිපාසයි. " ස්වාමීනි ...., මම පැමිණ බොන්නෙමි. ස්වාමීනි ..., ඔබවහන්සේ පිරිනමන තෑග්ග වන ශුද්ධාත්මයාණන් වහන්සේනේ පූර්ණත්වය ලබාගෙන ඔබවහන්සේට ස්තුති කරන්නෙමි. "

පසුගිය කලාපයෙන්

ඔබ තුළ සිටින දෙවියන් වහන්සේගේ ආත්මයෙන් ඔබේ ජීවිතය මනින්න....

කුරුසියේ ඇණ ගසන ලද ජීවිතය සැබෑ කරන්නේ ආත්මයාණන් වහන්සේය. එවිට ඔබට ආත්මයාණන් වහන්සේගේ දිව්‍යමය ඵල ප්‍රකාශ කිරීමට සහ උන්වහන්සේ සමඟ පියවර තැබීමට හැකිවේ.

ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම යන්නෙන් අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ ප්‍රකාශවීම, උන්වහන්සේ ඔබව සම්පූර්ණයෙන්ම සන්තකයේ තබා ගැනීම සහ ඔබව සම්පූර්ණයෙන්ම පාවිච්චි කිරීමයි. ආත්මයාණන් වහන්සේගේ ඵල යනු ඔබ තුළ සහ ඔබ තුලින් උන්වහන්සේගේ ශුද්ධකමේ සහ ජීවනයේ පූර්ණත්වය ප්‍රකාශ කිරීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබගේ ස්වභාවය සමඟ විශේෂ ජලාශයක් මෙන් මැනිය හැකි ලෙස ප්‍රීතිය ලබා නොදෙන සේක. උන්වහන්සේ ප්‍රීතියේ ආත්මයාණන් වහන්සේ වන අතර උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුළින් ප්‍රීතිය විදහා දක්වන සේක. උන්වහන්සේ ඔබට මනින්නට හැකි ලෙස ප්‍රේමය ලබා නොදෙන සේක. නමුත් උන්වහන්සේම ප්‍රේමය වන සේක. උන්වහන්සේ ඔබව පුරවන විට, උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුලින් ප්‍රේමය විදහා දක්වන සේක. උන්වහන්සේ ඔබ තුළ සීමා සහිත ප්‍රමාණයක් ගබඩා නොකරන සේක. උන්වහන්සේ සර්වබලධාරී තැනැන්වහන්සේ වන අතර උන්වහන්සේ ඔබව ශුද්ධ ජීවිතයේ දී සහ ඵලදායි සේවයේ දී ශක්තිමත් කරන විට ඔබේ පැවැත්ම තුළ උන්වහන්සේගේ ශුද්ධ බලය ප්‍රකාශ කරයි. උන්වහන්සේ ඔබට ශුද්ධකම ප්‍රමාණයකින් ලබාදෙන්නේ නැත. උන්වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ වන අතර ඔබ තුළ ඇති එකම ශුද්ධකම වන්නේ ඔබ තුළ ජීවත්වීමෙන් සහ ඔබ තුලින් උන්වහන්සේගේ ශුද්ධ ස්වභාවය ප්‍රකාශ කිරීමෙන් ඇති වන ශුද්ධකමයි.

දෙවියන් වහන්සේ මෘදු මොළොක් නමුත් බලවත් ආත්මයාණන් වහන්සේට ඔබ දක්වන ප්‍රතිචාරයෙන් ඔබගේ ජීවිතය මනින්න. උන්වහන්සේ කෙරෙහි ඔබගේ පිපාසයෙන් ඔබගේ ජීවිතය මනින්න. (මතෙව් 5:6, යෙසායා 55:1-2) ඔබගේ පිපාසය වැඩි වන තරමට උන්වහන්සේට ඔබව පිරවීමට හැකි වන සේක. ආත්මයාණන් වහන්සේගේ පැමිණීම සහ ක්‍රියා කිරීම සඳහා ඔබ කොයිතරම් ගැඹුරින් හා කොයිතරම් නිරන්තරයෙන් පිපාසිතව සිටිනවාද ... ? එයින් උන්වහන්සේගේ මුළු කැමැත්ත සහ උන්වහන්සේගේ අභිමුඛත්වය සඳහා ඔබ සැබවින්ම පිපාසයෙන් සහ ආශාවෙන් සිටිනවාද කියා ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබගේ හදවත කොයිතරම් ගැඹුරට උන්වහන්සේ උදෙසා ආශාවෙන් සිටිනවදා කියා මැන බලන්න. (ගීතාවලිය 42:1)

ඔබ ආත්මයාණන් වහන්සේට ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන්ම යටත් කර තිබෙනවාද ..? යන්නෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබ උන්වහන්සේට අවසර දෙන තරමට උන්වහන්සේ ඔබව සන්තකයේ තබාගන්නා සේක. ඔබ වැඩියෙන් අවස්ථාව ලබාදෙන තරමට උන්වහන්සේට වඩා වැඩියෙන් ඔබ තුළ වාසය කළ හැකිය. ඔබේ මුළු ආත්මයෙන් ඔබගේ කැපවීම කොයිතරම් සම්පූර්ණද, කොයිතරම් ස්ථාවරද යන්නෙන් ඔබේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේගේ කැමැත්තට ඇති පිපාසයෙන්, උන්වහන්සේගේ මුළු කැමැත්ත පිළිගැනීමේ ප්‍රීතියෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේට සම්පූර්ණයෙන්ම භාරවීම මත ඔබගේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේට කීකරුවීමේ ස්ථාවර බව තුළින් ක්ෂණිකව ඔබගේ කීකරුවීම සහ කීකරුකම කරුණුකොටගෙන ඔබගේ ප්‍රීතියේ පූර්ණත්වය තුළින් ඔබගේ ජීවිතය මැන බලන්න. ශුද්ධාත්මයාණන් වහන්සේට කීකරුවන්නන්ට උන්වහන්සේව ලබාදෙන සේක. (ක්‍රියා 5:32) ඔබ වැඩියෙන් කීකරුවෙන තරමට උන්වහන්සේ ඔබ තුළ පූර්ණ ලෙස වාසය කරන සේක. ඔබගේ කීකරුකම තුලින් ආත්මයේ සම්පූර්ණත්වය මැන බලන්න.

ඔබ තුළ සහ ඔබ තුලින් ආත්මයාණන් වහන්සේ ප්‍රකාශ වන ආකාරයෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබ උන්වහන්සේගේ නිහතමානීකම ඔබගේ ජීවිතයෙන් කොයිරතම් බෙදාගන්නවාද යන්නෙන් එය මැන බලන්න. ඇත්තටම ඔබට ඔබගේ කිසිවක් නොමැති බව දැනෙනවාද .. ? නැතහොත් ඔබට සාමාන්‍යයෙන් ස්වයං විශ්වාසයක් දැනෙනවාද .. ? උන්වහන්සේගේ පාරිශුද්ධභාවයෙන් එය මැන බලන්න. ඔබ ඇත්තටම ලෞකික ආශාවන් සහ හැගීම් නොමැතිකම් අත්විඳින්නේද .. ? උන්වහන්සේගේ ප්‍රේමයෙන් එය මැන බලන්න. ඔබ සැබවින්ම උන්වහන්සේගේ ප්‍රේමය අත්විඳිනවාද .... ? නැතහොත් එය ඔබ තුළ පවතින්නේ නාමිකව පමණක්ද .. ? ආත්මයාණන් වහන්සේ ඔබ තුලින් නිරන්තරයෙන් ප්‍රීතිවෙන ආකාරයෙන්, උන්වහන්සේගේ අනුකම්පාව කොයිතරම් ගැඹුරින් ඔබ ක්‍රියාත්මක කිරීමට ආශාවන්නේද යන්නෙන් සහ උන්වහන්සේ තුළ ඔබ කොයිතරම් ඉවසිලිවන්තව විඳ දරා ගන්නේ ද යන්නෙන් ඔබගේ ජීවිතය මැන බලන්න.

ඔබ ඔබගේම උත්සාහයෙන් කොපමණ දේ කරනවාද යන්න නොව, උන්වහන්සේ ඔබ තුලින් කොපමණ දේ කරනු ලබනවාද දෙවියන් වහන්සේම උන්වහන්සේගේ ආත්මයෙන් ඔබ තුළ වාසය කරන පිණිස ඔබව ඔසවනු ලැබුවේද, ඔබව මුදාගනු ලැබුවේද යන කාරණාවලට අරමුණ මෙයයි. ලාභ සහ සුළු සුළු භූමික පියවර වලින් නොව, ඔබ තුළ දෙවියන් වහන්සේගේ ආත්මය වාසය කිරීමෙන් ඔබගේ ජීවිතය මැන බලන්න.

"මක්නිසාද මාගේ ගෘහය සියලු ජනයන්ට යාච්ඤා ගෘහයක් යයි කියනු ලබන්නේය." (යෙසායා 56:7)

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

අපගේ සදාකාලික ජීවමාන මැදහත්කරුවා

"එබැවින් උන්වහ්නසේ කිට්ඨුකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරන්තරවම ජීවත්වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහන්සේට පුළුවන." (හෙබ්‍රෙව් 7:25)

යේසුස් වහන්සේ සදාකල්ම ජීවමානව සිටින්නේ අප උදෙසා මැදහත්කම් කිරීමට බව එහි පවසයි. උන්වහන්සේගේ මුළු ජීවිතයම උන්වහන්සේගේ අසීමිත, නිමක් නැති, උත්කර්ෂවත් (මහිමාන්විත) පැවැත්ම තවමත් උන්වහන්සේගේ සෙනඟ උදෙසාය. උන්වහන්සේ මට ප්‍රේමකොට තමන්වහන්සේ ජීවිතය මා වෙනුවෙන් දුන් සේක. එය සැබෑවකි. නමුත් අපි කැමති නම් එය වර්තමාන කාලයටත් කියවිය හැකි අතර එය තවමත් සත්‍යව තිබේ. උන්වහන්සේ මට ආදරෙයි. උන්වහන්සේ මා වෙනුවෙන් උන්වහන්සේගේ ජීවිතය දුන් සේක. ක්‍රිස්තුස් වහන්සේ තම සභාවට ප්‍රේම කළ අතර ඒ සඳහා තමන් වහන්සේවම පූජා කළ සේක. දැන් උන්වහන්සේ තම සභාවට ප්‍රේමකොට එයට තමන්වම ලබාදෙන සේක. අප වෙනුවෙන් නිමක් නැති ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය මොනතරම් ආශ්චර්යයක්ද ..? උන්වහන්සේ සම්පූර්ණයෙන්ම අප වෙනුවෙන් ජීවත්වන බැවින් අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම උන්වහන්සේ වෙනුවෙන් ගතකිරීමට ඉඩ හරිමු.

ජීවමාන ක්‍රිස්තුස් වහන්සේගේ මෙම සත්‍යතාවය අපගේ මහත් වූ අවශ්‍යතාවයේ දී අපි සිහිකල යුතුය. ප්‍රිය මිත්‍රවරුණි, අපගේ ඉහළම ප්‍රයෝජනය සඳහා සැමවිටම ජීවත්වන සර්වබලධාරී හා දිව්‍යමය තැනැත්වහන්සේ ස්වර්ගයේ සිටින සේක. අපි උන්වහන්සේව ඉතාමත් ආදරයෙන් නමස්කාර කරමු. අපගේ මහත් වූ අවශ්‍යතාවය කොයිතරම් විශාල ද යන්න මෙයින් අපට පැහැදිලිය. එනම් අප වෙනුවෙන් මැදිහත්වීමට සමවිටම ජීවත්වන මැදහත්කරුවෙක් අපට අවශ්‍යවන අතර මිය යන මැදහත්කරුවෙක් ප්‍රමාණවත් නොවන බවත් පැහැදිලිය. අපගේ ජීවතවල තවමත් අවශ්‍ය වන්නේ අපගේ ජීවිතවල සෑම මොහොතකම අපගේ ආත්ම රැකවරණයේ තබා ගැනීමට හැකි, සෑම ආකාරයකින්ම අප වෙනුවෙන් මැදහත්වන සියලු නපුරෙන් අපව ගලවා ගන්නා වූ ජීවමාන ගැලවුම්කරුවෙකි. අපගේ අවශ්‍යතාවය සෑමවිටම පවතියි. යේසුස් වහන්සේ සෑම විටම අපව ආරක්ෂා කරන අතර උන්වහන්සේගේ කාර්යය කිසිවිටෙකත් අනවශ්‍යය දෙයක් නොවේ. අපගේ මහත් සැනසිල්ල මෙහි තිබේ. අපගේ උරහිස් දැඩි ලෙස තදවන විට අපි නැවතත් මෙම සත්‍යතාවය වෙතට හැරී යා යුතුය. යේසුස් වහන්සේ ජීවමානව සිටින සේක. මගේ ශ්‍රේෂ්ඨ මිදුම්කරු මා වෙනුවෙන් ජීවත් වේ. උන්වහන්සේ සියලු බලයෙන් සහ තේජසින් පූර්ණව ජීවත්වන අතර සෑම රෝග යකින්ම අපව ආරක්ෂා කරන සේක. විවේක ගන්නා වූ ආරක්ෂකයෙකු මට ප්‍රමාණවත් නොවේ. යේසුස් වහන්සේ උන්වහන්සේගේ සදාකාලික වූ ජීවිතයේ ශක්තිය ලබාදෙන්නා වූ අයට කොපමණ ආශිර්වාද ලැබේවිද .. ?

ප්‍රිය සෙනෙහෙවන්තය, අපගේ සැනසීම මෙයයි. අපට සිටින්නේ එක් පූජකයෙක් පමණි. උන්වහන්සේ සදාකාලයටම ජීවත්වේ. උන්වහන්සේට පෙර කිසිවෙක් නොසිටි අතර උන්වහන්සේට පසුව කිසි කෙනෙකු සිටින්නේද නැත. මක්නිසාද උන්වහන්සේ අප වෙනුවෙන් උත්තම පූජකධූරය ක්‍රියාත්මක කිරීමට පුද්ගලිකවම ජීවත්වන බැවින් මාගේ ආත්මය උන්වහන්සේගේ එකම පූජාවේ ඇදහිල්ල තුළ නැවතී ඇත. වෙන කෙනෙකුට එම පූජාව කළ නොහැකිය. මන්ද එකම තැනැත්තා සර්වපරාක්‍රමයාණන් වහන්සේ වන අතර, කිසිවිටෙකත් උන්වහන්සේ මරණයට පත්වන්නේ නැත. යේසුස් වහන්සේ මගේ හදවත කියවන සේක. එය ස්පන්දනයවීමට පටන්ගත් දවසේ සිට උන්වහන්සේ නිතරම එය කියවන සේක. උන්වහන්සේ මගේ දුක්ගැනවිලි දන්නා අතර අතීතයේ සිටම මාගේ දුක දරාගෙන සිටින සේක. මහළුවියේ මගේ ශක්තිය හීනවන විටත් මාව උසුලන සේක. මා මරණයේ නින්දට වැටෙන විට උන්වහන්සේ නොමැරී උන්වහන්සේගේ නොමියන ආශිර්වාදයට මා පිළිගැනීමට සූදානම්ව සිටින සේක. ක්‍රිස්තුස් වහන්සේගේ පූජකත්වයේ නොබිඳුණු අඛණ්ඩ පැවැත්ම සහ සදාකාලිකත්වය ගැන අප ප්‍රීති නොවන්නෙමුද .. ?

නොකඩවා මැදිහත්වීමේ අවශ්‍යතාවය

යේසුස් වහන්සේ අප වෙනුවෙන් නොකඩවා ආයාචනා නොකළසේක් නම්, අපගේ ස්වභාවය තුළ ඇති දුර්වලතා සහ පාප වලින් අඛණ්ඩව ආරක්ෂාවීමට බලාපොරොත්තුව කොහිද .. ? මාර්ගය රළුය. ලෝකය පව්කාරය, අපගේ නිදැල්ලේ යාම් බොහෝය. අපගේ ආශාවන් නොනවතියි. එබැවින් අපට සදාකාලික මැදහත්කරුවෙක් අවශ්‍ය වේ. අප කිසිවිටෙක අනතුරෙන් මිදී නැත. එබැවින් සෑමවිටම ආරක්ෂක යාච්ඤාව අවශ්‍ය වේ. අපි කිසිවිටෙක දුර්වලකමට සහ මෝඩකමට වඩා ඉහළින් නොසිටිමු. එබැවින් අපගේ ආරක්ෂකයාගේ සදාකාලික අනුග්‍රහය අවශ්‍ය වේ. ඔබ අතරේ අවශ්‍යතාවයක් නැති පුරුෂයා කවුද .. ? ඔබ අතරේ දිනකට බොහෝ වාරයක් කරුණාසනය වෙතට පැමිණීමට අවශ්‍ය නැති කාන්තාවක් සිටීද .. ? යේසුස් වහන්සේ සෑමවිටම අපගේ අවශ්‍යතාවයන් ඉදිරිපත් කිරීමට එහි බලා සිටින සේක. එබැවින් අපගේ ඉල්ලීම්, අපගේ ප්‍රශංසාව දෙවියන් වහන්සේ ඉදිරියේ පිළිගත හැකිවේ. අප දිනපතා පීඩනයට පත්වන්නේ අපගේ පාපය සමඟ ගැටීමෙන් හෝ ශරීරය තුළ දුක්විඳීමෙන්ය. මේ සියල්ල සඳහා අපට අපගේ ස්වාමීන් වහන්සේගේ සේවයෙන් ශුද්ධස්ථානයේ උපකාරය අවශ්‍ය වේ. එය ස්වර්ගය කරුණාවේ සිංහාසනය මාර්ගයෙන් පමණක් පැමිණිය හැකිය. අපට මැදහත්කරුවෙකු අවශ්‍යවේ. උන්වහන්සේගේ පාමුල අපේ බර තැබීමට සහ අපගේ වේදනාවන් පැවසීමට හැකිය. එබැවින් අප වෙනුවෙන් මැදහත්වීමට යේසුස් වහන්සේ සැමදා ජීවත්වන සේක.

ගණන් කළ නොහැකි ආශිර්වාද

අපගේ ශ්‍රේෂ්ඨ මැදහත්කරුවාණන් අපගේ වර්ධනයට සහ ප්‍රයෝජනයට අවශ්‍ය අනර්ඝ වූ ත්‍යාග සහ වරප්‍රසාද අප වෙනුවෙන් ලබාදෙන සේක. මේ ලෝකයේ දී අපගේ සේවයට අවශ්‍ය සහ මතු ජීවිතයේ ප්‍රයෝජනයට අවශ්‍ය ආත්මික ජීවිතයේ එම ජයග්‍රහණය කරා අපව ගෙනයන හස්තය උන්වහ්නසේය. දෙවියන් වහන්සේගේ කැමැත්ත කිරීමට සෑම යහපත් ක්‍රියාවකදීම අපව පරිපූර්ණ කිරීමට උන්වහන්සේගේ යාච්ඤාවෙන් අපව වැඩි වැඩියෙන් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ගෙන නොයන්නේ නම් උසස් ගුණධර්මවලට අපට ළඟාවිය නොහැකි වේ.

දුෂ්ඨ වූ සදාකාලික සතුරෙක් සිටින බව ඔබටත් අමතක ද.. ? දෙවියන් වහන්සේ ඉදිරියේ සහෝදරයන්ට විරුද්ධව රැ දහවල් චෝදනා කරන වරද තබන්නෙකු ලෙස ඔහු ක්‍රියාකරනු ලබයි. අප වෙනුවෙන් මැදහත්කාරකම් කරන්නා වූ අපගේ මැදහත්කරුවාණන් නොසිටියේ නම් අපට කුමක් සිදුවේවිද .. ? මෙම චෝදකයා අපව පරීක්ෂා කරන්නෙකු ද වන අතර ඔහු අපව හෙලා දැකීමට සූක්ෂම ලෙස කුමන්ත්‍රණය කරනු ලබයි. එය ප්‍රේත්‍රැස්ට මෙන් අප සම්බන්ධයෙන් ද සත්‍යව තිබේ. ***"සීමොන් .., සීමොන් ..., බලව නුඹලා ගෝධුම වෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. නමුත් නුඹේ ඇදහිල්ල නැති නොවන පිණිස නුඹ උදෙසා මම යාච්ඤා කළෙමි. නුඹ නැවත හැරැෂායින් පසු නුඹේ සහෝදරයන් ස්ථිර කරපන්යැයි කී සේක."*** (ලූක් 22:31-32) යේසුස් වහන්සේගේ යාච්ඤාවලින් අපි කොපමණ වාරයක් නපුරෙන් ආරක්ෂා වී සිටිනවාද . ? මාගේ සහෝදරයෙනි, අපගේ ස්වාමීන් වහන්සේගේ මැදිහත්වීමේ පළිහට විෂ සහිත ඊතල කීයක් හසුවී ඇද්දැයි අප නොදනිමු. ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්වීම සැමවිටම ආශිර්වාදය විහිදුවයි.

(චාර්ල්ස එච්. ස්පර්ජන් විසිනි) (1834 - 1892)

යේසුස් වහන්සේ මෙසේ අසන සේක. ***"නුඹ වුහුදේ උල්පත් ළඟට පැවිණියෙහිද ... ? නොහොත් ගැඹුරේ භූමි තැන්වල ඇවිද්දෙහිද ... ?"*** (යෝබ් 38:16) නිසැකවම අපගේ ස්වාමීන් වහන්සේගේ මැදිහත්වීම ආශිර්වාද සාගරයක උල්පතයි. අපිට ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ප්‍රබෝධමත් වූ දෑස් තිබුණේ නම් ගිණි අශ්වයන්ගෙන් පිරුණු කන්දක් ද, දෙවියන් වහන්සේගේ සෙනඟ වටේට ගිණි අශ්ව රථ ද අපි දකින්නෙමු. ඒ අශ්වයන්ට මඟපෙන්වන්නේ කවුද .. ? එම රථ මෙහෙයවන්නේ කවුද .. ? ආරක්ෂාව පිණිස දෙවියන් වහන්සේගේ සෙනඟගේ කඳවුර වටකර සිටින ආත්ම සේනාවල ප්‍රධානියා කවුද.. ? උන්වහ්නසේ සර්වබලධාරීත්වයෙන් මැදිහත්වී අප වෙනුවෙන් සියල්ල පාලනය කරන එම්මානුවෙල් නම් තැනැත්වහන්සේය.

යේසුස් සම්දානන් වහන්සේ සිය නොනවතින ආයාචනා කිරීම මගින් අන්ධාකරයේ සියලු බලයන් පාලනය කරන අතර අපගේ ගැලවීම සඳහා ආලෝකයේ සියලු බලයන් ක්‍රියාත්මක කරනු ලබයි. උන්වහන්සේගේ යාච්ඤාවෙන් අපට ජීවත්වීමට , ගමන් කිරීමට ආශිර්වාදයේ වාතාවරණයක් සාදනු ලබයි. වෙහෙසට පත්නොවන අපගේ මැදහත්කරුවාණන්ගේ නොනවතින රැකවරණය සඳහා අපගේ බැඳීමේ ගැඹුර අපි නොදනිමු. ඒවා අපට ගණන් කිරීමට නොහැකිය. ගැලවීම ලැබූ ශුද්ධවන්තයන්ගේ ප්‍රීතියේ අඛණ්ඩ පැවැත්ම උන්වහන්සේගේ නිමක් නැති මැදිහත්වීම නිසා සිදුවනු ඇත.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.